# සී.ස. ලංකා නැව් සංස්ථාව

(1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා සහ රජය සතු ව්‍යාපාරික ආයතන රජයේ සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ 1992.06.01 වන දින සිට සමාගමක් බවට පරිවර්තනය කර ඇත)

# වාර්ෂික වාර්තාව

# 2012/2013



# සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

# 2012-2013

| පටුන | පිටු අංකය |
|---|---|
| පටුන | 1 |
| පිළිගැන්වීමේ ලිපිය | 2 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 3 |
| කළමනාකරණ කණ්ඩායම | 4-5 |
| සභාපතිවරයාගේ සමාලෝචනය | 6-7 |
| අධ්‍යක්ෂක වරුන්ගේ වාර්තාව | 8-9 |
| විගණන කමිටුවේ වාර්තාව | 10-11 |
| තුති ප්‍රණාමය හා කාර්ය මණ්ඩලයට ස්තුතිය | 12 |
| විගණක වරුන්ගේ වාර්තාව | 13-14 |
| ආදායම් ප්‍රකාශය | 15 |
| ශේෂ පත්‍රය | 16-17 |
| කොටස් ආයෝජන වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 18 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 19-20 |
| මූල්‍ය වාර්තා සඳහා සටහන් | 21-65 |

## **සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය**

## **2012/2013**

## **පිළිගැන්වීමේ ලිපිය**

ගරු මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,

මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය,

අංක 19, චෛත්‍ය පාර,

කොළඹ 01.

අමාත්‍යතුමනි,

රාජ්‍ය සංස්ථා සහ රජය සතු සමාගම් රාජ්‍ය සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා වූ 1987 අංක 23 දරණ සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාරව 2012.04.01 දින සිට 2013.03.31 දින දක්වා වූ කාල පරච්ඡේදය තුල සමාගමේ ක්‍රියාකාරකම් පිළිබඳ සම්පාදිත වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය මෙයින් ඉදිරිපත් කරමි.

මීට,

විශ්වාසී,

වයිස් අද්මිරාල් ජයනාත් කොළඹගේ RSP, VSV,USP,reds, psc, MSC(DS), MA(IS), Dip in IR, Dip in CR, FNI (Lond)

**වැ.බ. සභාපති**

**සී.ස. ලංකා නැව් සංස්ථාව**

අංක 27, යෝනක ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථාන ගොඩනැගිල්ල

ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත

කොළඹ 01.

2014 මැයි මස 19 වැනි දින.

## **සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය**

## **2012-2013**

**අධ්‍යක්ෂ මණ්ඩලය**

කාන්චන රත්වත්තේ මහතා,
සභාපති
2012.01.06 දින සිට 2012.02.14 දින දක්වා ඉවත්ව සිට 2012.03.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත පත්කරන ලදී.

මහේන්ද්‍ර විජේසේකර මහතා - විධායක අධ්‍යක්ෂ
2012.03.22 දින සිට අද දක්වා

ආසිරි ඉද්දමල්ගොඩ මහතා - අධ්‍යක්ෂ
2010.05.31 දින සිට අද දක්වා

ආරියසීල වික්‍රමනායක මහතා - අධ්‍යක්ෂ
2010.05.31 දින සිට අද දක්වා

චන්දන ගමගේ මහතා - අධ්‍යක්ෂ
2010.05.31 දින සිට අද දක්වා

අජිත් අබේසේකර මහතා - අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත
2010.06.07 දින සිට අද දක්වා

ඩබ්.ඩී. ප්‍රසන්න පීරිස් මහතා - අධ්‍යක්ෂ
2010.07.15 දින සිට අද දක්වා

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ඊ.එම්.එස්. පෙරේරා මහත්මිය
(නීතිඥ, වරාය කළමනාකරණය හා නැව් කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී නෙදර්ලන්තය)

විගණකවරු
ටී.ඇන්ඩ් ඩී. ඇසෝසියේට්ස්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම
සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පහක් (5) පවත්වන ලදී.

## ශ්‍රී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

**කළමනාකරණ කණ්ඩායම**

සාමාන්‍යාධිකාරී
සුනිල් ඕබඩගේ මහතා
ශාස්ත්‍රවේදී උපාධිධාරී එම්අයිසීඑස් (එංගලන්තය)
නැව් කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී, එම්අයිසීඑස් (ඔස්ලෝ)

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ හා මෙහෙයුම්)
එස්.එම්.ඩී.එන්.ධර්මප්‍රිය මහතා
විද්‍යාවේදී, සාගර අධ්‍යයන විද්‍යාපති (එක්සත් රාජධානිය) එම්අයිඑල්ටී

නෛතික හා රක්ෂණ/මානව සම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ඊ.එම්.එස්.පෙරේරා මහත්මිය (නීතිවේදී)
(වරාය, නාවික හා ප්‍රවාහන කටයුතු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී - නෙදර්ලන්තය)

සහකාර සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සංවර්ධන/මානව සම්පත්)
ක්‍රිස් වීරසිංහ මහතා
එම්බීඒ- ලන්ඩන් විශ්ව විද්‍යාලය (අවසාන වාරය සම්පූර්ණ කිරීමට නියමිත)
පරිගණක ක්‍රම පද්ධති පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධිධාරී පරිගණක මෘදුකාංග පිළිබඳ ලන්ඩන් උසස් ජාතික ඩිප්ලෝමාධාරී

මූල්‍ය කළමනාකරු
ජී.එම්.විකුම් ප්‍රදීප මහතා
වාණිජ විද්‍යාවේදී (විශේෂ පංතිය) ගෞරව එල්අයිසීඒ
නාවික කටයුතු කළමනාකරණ විද්‍යාපති (මැල්මෝ - ස්වීඩන්)

අභ්‍යන්තර විගණක
වයි. පොන්නම්පෙරුම මහතා
එෆ්එම්ඒඒටී, එල්අයිසීඒ
නාවික කටයුතු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

කළමනාකරු (ව්‍යාපාර සංවර්ධන)
සී. ජයසිංහ මහත්මිය
එෆ්අයිසීඑස්, එම්අයිඑල්ටී - එක්සත් රාජධානිය
ජාත්‍යන්තර නාවික කටයුතු පිළිබඳ විද්‍යාපති (එක්සත් රාජධානිය)
නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරී (ඔස්ලෝ)

කළමනාකාරිණී (එන්වීඕසීසී, ප්‍රලේඛණ)
ජයන්තා ඉන්ද්‍රනීල මෙනවිය
නාවික කටයුතු පිළිබඳ ඩිප්ලෝමාධාරිණී (ඔස්ලෝ)

කළමනාකරු (නැව් කුලී සේවා සහ නියෝජ්‍යායතන)
එම්.ඩී.කේ. ජයවංශ මහතා
ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරී
කළමනාකරණ අධ්‍යයනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාධාරී
එෆ්අයිසීඑස් (එක්සත් රාජධානිය) සීඑම්අයිඑල්ටී (එක්සත් රාජධානිය)
ඩීපීඑස් (ගෞරව) ඔස්ලෝ

පරිපාලන ප්‍රධානී
එච්.ආර්.එල්.පී.පී. ගුණරත්න මහතා
කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාධාරී - විවෘත විශ්ව විද්‍යාලය
ව්‍යාපාර තොරතුරු පිළිබඳ ඩිප්ලෝමාධාරී
නාවික පුහුණු වැඩසටහන් පාඨමාලාව - සීඑස්සීඑල්

## සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

## 2012-2013

### 2012/2013 වර්ෂය සඳහා සභාපතිවරයාගේ සමාලෝචනය

සී/ස. ලංකා නැව් සංස්ථාව සමාලෝචනයට අදාල වර්ෂය තුලදී සුවිශේෂී ප්‍රගතියක් අත්කරගෙන ඇති බව කිව මනාය. ඉහත වර්ෂයේ බද්දට පසු ලාභය වූ රු.මිලියන 84.20 ට සාපේක්ෂකව මෙම වර්ෂයේදී අත්කරගෙන ඇති ලාභය රු.මිලියන 218.79 කි. මෙය වාර්තාගත 159% ක වර්ධනයකි. සී/ස. ලංකා නැව් සංස්ථාව මෙම ප්‍රගතිය අත්කරගෙන තිබෙනුයේ සේවාවන් සඳහා වූ ඉල්ලුම අබිභවා ප්‍රධාන වශයෙන්ම අත්‍යාධික සැපයුම් හේතුකොටගෙන පොදුවේ නාවික කර්මාන්තයේ සියළුම වෙළඳපොල අංශ වෙතින් අනවරත පසුබෑමක් විද්‍යාමාන වූ අඳුරු භූමිකාවක් තුල වීම සුවිශේෂී කරුණකි. 2008 වර්ෂයේ උද්ගත වූ ආර්ථික අවපාතයේ අහිතකර බලපෑම්වලට ද නාවික කර්මාන්තය නිරතුරුවම මුහුණ පෑවේය. නාවික ක්ෂේත්‍රය පිළිබඳව විශ්ලේෂණාත්මක මතය කුමක් වුවද ආර්ථික අවපාතයට පෙර පැවති තත්වය ප්‍රකෘතිමත් වීම සඳහා ලංකා නැව් සංස්ථාව තවමත් අපේක්ෂා සහගතව සිටී.

සමාලෝචිත වර්ෂය තුලදී ලංකා නැව් සංස්ථාව විසින් අත්කර ගත් සමස්ත පිරිවැටුම රු.මිලියන 850.7 ක් වූ අතර මෙය ඉහත වර්ෂයේදී අත්කරගත් පිරිවැටුම මත රු. මිලියන 339 ට සාපේක්ෂකව 150% වර්ධනයක් බව කිවමනාය. තවද, සමස්ථ පිරිවැටුම සම්බන්ධයෙන් සළකා බැලීමේ දී ව්‍යාපාරික අංශයක් වන ගල් අඟුරු ප්‍රවාහන කටයුතුවලින් ලද රු. මිලියන 237.7 ක දායකත්වය ද සඳහන් කිරීම වටී. අදාල වර්ෂය තුලදී ලංකා නැව් සංස්ථාවේ කළමනාකාරිත්වය විසින්, වඩාත් ආර්ථික ප්‍රතිලාභ අත්කරගත හැකි වන පරිදි 2010 සිට බලාත්මක වන අයුරු ගල් අඟුරු ප්‍රවාහනය කිරීමේ ගිවිසුම ප්‍රතිසංවිධානය කිරීම මගින් සමාගමේ පිරිවැටුම පමණක් නොව ලාභයද ඉහල නැංවීම පිණිස මහඟු දායකත්වයක් සැපයුනු බව සඳහන් කළ යුතුය.

සමාලෝචිත වර්ෂයේදී කොටසක් වෙනුවෙන් වූ ඉපැයීම රු. 43.76 වූ අතර ඉහත වර්ෂයේදී එය රු. 16.84 ක්ව පැවතුනු අතර එම වර්ෂයට සාපේක්ෂව මෙම වැඩිවීම 159.8% කි. තවද, වසර තුලදී ලැබූ විශේෂිත ලාභය හේතු කොට ගෙන, සී/ස. ලංකා නැව් සංස්ථාවේ එකම කොටස්කරුවා වූ මහාභාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට රු. මිලියන 10 ක අතුරු ලාභාංශයක් ගෙවීමට හැකිවිය.

ලංකා නැව් සංස්ථාවට අයත් නැව් එනම් ලංකා මහපොල සහ ලංකා මුදිත යන නැව් දෙක ඉතා පැරණි බැවින් හා වාණිජ වශයෙන් ලාභ ලබාගත හැකි කිසිදු කටයුත්තක යෙදිය නොහැකි බැවින් විකිණීම සඳහා කටයුතු කරන ලදී. රජයේ සහායද ඇතිව අළුතින් නැව් දෙකක් මිලදී ගැනීමේ කටයුතු දැනට අඛණ්ඩව කෙරීගෙන යමින් පවතී. ගල්අඟුරු තොග ප්‍රවාහනය කිරීම සඳහා නැව් දෙකක් තැනීම පිණිස මිනි නැව් තාටාකාංගනයක් සමඟ ගිවිසුමක් අත්සන් කරනු ලැබ තිබේ. මීට මෙරට රාජ්‍ය බැංකුවක් වෙතින් රජයේ ඇප සහතික වාණිජ ණයකර ලබාදීමට නියමිතය.

මෙරට ජාතික ප්‍රවාහකයා වශයෙන් සී/ස. ලංකා නැව් සංස්ථාවේ අනාගතය ගැන සළකා බලනකල ගල් අඟුරු, බොරතෙල් සහ රසායනික පොහොර වැනි වෙළඳ ද්‍රව්‍යයන් තොග වශයෙන් මෙරටට ආනයනය කිරීමේ සුවිශේෂී අයිතිය සී/ස. ලංකා නැව් සංස්ථාව සතුවීම ද, නාවික සංස්ථාවට තමන්ගේම නාවික යාත්‍රා ඇණියක් දිගුකාලීනව ගොඩනඟා ගැනීමට සහාය සැලසීමද සංස්ථාව ස්ථාපනය කිරීමේ ඒකායන අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා නැව් දිගුකාලීනව කුලියට ගැනීම ද යන කරුණු මෙහිදී විශේෂ වැදගත්කමක් උසුලයි.

සී/ස. ලංකා නැව් සංස්ථාවේ අරමුණු අතර, රටේ බාහිර වෙළඳාම් කටයුතුවල නිරතවීම හා නාවික කටයුතු පුහුණුවීම් අපේක්ෂා කරන නැවියන්ට නැව්තුල පුහුණුවීම් සඳහා අවස්ථා සලසාදීම මගින් සහාය සැලසීම යනාදී කරුණු ප්‍රමුඛස්ථානයෙහි ලා සැලකේ. මේ සම්බන්ධයෙන් රජයෙන් ලබාදෙන සහාය ඉතා දිරිගන්වන සුළු බව කිව මනාය.

ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල නිරත තෙවැනි පාර්ශව නැව්වල ඉඩකඩ විකිණීම හා මිලදී ගැනීම මගින් සහ විදේශීය නැවු සමාගම් විසින් දැනට ප්‍රවාහනය කරනු ලබන රජයේ නැව්බඩු මුහුදු මගින් ප්‍රවාහනය කිරීමේ අයිතිය නැව් සංස්ථාව වෙත ලබාගැනීමත් මගින් සී/ස. ලංකා නැව් සංස්ථාව තම ආදායම ඉහල නංවා ගැනීම අත්‍යාවශ්‍යය. තවද, ශ්‍රී ලංකාව නාවික කේන්ද්‍රස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියට අනුව යමින් දැනට පහසුකම් සැපයෙන හා දිරිගන්වනු ලබමින් තිබෙන විකල්පමය අංශයෙන් එනම් නැව්වලට තෙල් සැපයීම, මුහුදුබඩ සේවා, පොදු පරිශීලක ගුදම් වැනි ප්‍රස්ථාවන් සමාගම විසින් ප්‍රයෝජනයට යොදා ගත යුතුව තිබේ. සී/ස. ලංකා නැව් සංස්ථාව තම සේවා දායකයන් වෙනුවෙන් සුභසාධන කටයුතු සැලසීමෙහි ලා අඛණ්ඩව නිරත වෙමින් සිටින අතර, ඔවුන්ගේ පුහුණු වැඩසටහන් පමණක් නොව වෘත්තීයමය අධ්‍යයන පාඨමාලාවන්ට අනුග්‍රහය ලබා දෙමින් යාවත්කාලීන දැනුමෙන් හා නිපුණතාවන්ගෙන් ඔවුන් සවිබල ගැන්වීමේ ක්‍රියාවලියක නිරත වෙමින් සිටී. ලංකා නැව් සංස්ථාවට කැපීපෙනෙන ප්‍රගතියක් සාක්ෂාත් කරගැනීමට හැකි වූයේ කැපවීමෙන් යුතුව කටයුතු කල සේවක මහත් මහත්මීන්ගේ ප්‍රශංසනීය සේවාව හේතු කොට ගෙනය.

තවද, අවසාන වශයෙන් අප සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයට, රේඛීය අමාත්‍යාංශයට, අපගේ සියළු ගණුදෙනුකරුවන්ට මෙන්ම ව්‍යාපාරික කොටස්කරුවන්ට, ඒජන්ත වරුන්ට සහ සෙසු පාර්ශවකරුවන්ට ඔවුන් විසින් සංස්ථාව වෙත දක්වන ලද සහාය හා සහයෝගිතාව වෙනුවෙන් ස්තුතිය පුදකරන අතර, ඉදිරි වර්ෂයේදී ද ඔවුන්ගේ වැඩි හවුල්කාරත්වයක් මෙන්ම අනුග්‍රහයද අපේක්ෂා කරමි.

# සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය

## 2012-2013

### 2012/2013 වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සී/ස. ලංකා නැව් සංස්ථාව විසින් නැව් මිලදී ගැනීම පිළිබඳව ඉදිරිපත් කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාවෙන් ඉක්බිතිව මහාභාණ්ඩාගාරයේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ නිර්දේශ අනුව අළුතින් නැව් මිලදී ගැනීම සඳහා වූ ක්‍රියා පිළිවෙල සී/ස. ලංකා නැව් සංස්ථාව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ලංකා විදුලිබල මණ්ඩලය විසින් දැනට මෙරටට ආනයනය කෙරෙන තාපබල ගල්අඟුරු ප්‍රවාහනය පිණිස මූලික වශයෙන් MT DWT 63600 ක ධාරිතාව ඇති නැව් දෙකක් චීනයේදී ඉදිකිරීම පිණිස, අදාල රාජ්‍ය නියෝජිත ආයතන සමඟ දැනට කටයුතු කෙරමින් පවතී.

දැනට ලංකා නැව් සංස්ථාව සතුව තිබෙන එම්.වී. මුදිත නෞකාව අක්‍රිය තත්වයෙන් ගාළු වරායේ තවදුරටත් නතරකොට තිබෙන අතර එය සුදුස්සක් කොට බැහැර කිරීම සඳහා ටෙන්ඩර් පරිපාටියක් අනුගමනය කෙරෙමින් පවතී. සමාගමට අයත් අනෙක් නෞකාව වන ලංකා මහපොල හිස් නැවක් වශයෙන් කුලියටදී තිබූ අතර එම නැව කුලියටගත් තැනැත්තා කුලී ගිවිසුමේ කොන්දේසි කඩකිරීමේ හේතුවෙන් උද්ගතව ඇති තත්ත්වය විසඳීම සඳහා තීරක තීන්දුවක් ලබා ගැනීම පිණිස යොමු කරනු ලැබ තිබේ.

ගිවිසුමේ කොන්දේසි කඩකල සමාගම වෙතින් නැව ආපසු ලබා ගැනීම පිණිස කටයුතු කෙරෙමින් පවතී.

තවද, නෞකාමය නොවන පොදු ප්‍රවාහන (NVOCC) පදනම යටතේ තෙවැනි පාර්ශව නාවික යාත්‍රාවල ඉඩ කුලියට ගැනීම මගින් සාමාන්‍ය නැව් බඩු නැව් මගින් ප්‍රවාහනය කිරීමේ සේවාවන් හි ද, සී/ස. ලංකා නැව් සංස්ථාව නොකඩවා නිරත විය. ලංකා නැව් සංස්ථාවේ ප්‍රධාන නැව්බඩු පදනම වූ කලී දැනට ක්‍රියාත්මක වන අංක FIN 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය යටතේ ඊට පිරිනමන ලද රජයේ නාවික භාණ්ඩ මෙරටට හා පිටරටවල් වලට ප්‍රවාහනය කිරීමේ අවසරයයි. එබඳු සේවාවන් ඉටුකරන අතරතුර විසිරිතොග නැව් බඩු ඇතුළු සියළු වර්ගයේ ආනයනයන්ට අදාලව සැලකිය යුතු ප්‍රමාණයක නැව් බඩු තොග මෙහෙයුම් කිරීමට නැව් සංස්ථාවට හැකිවිය. ඉහත වර්ෂය හා සසඳා බලන කල මෙයින් කැපීපෙනෙන වර්ධනයක් විද්‍යාමාන වන බව කිව හැකිය. එහෙත් FCL සහ LCL අපනයන නැව් බඩු තොග සම්බන්ධයෙන් පසුගිය වසරට වඩා සීඝ්‍ර පසුබැසීමක් අදාල වර්ෂය තුල සිදුවිය.

නෞකාමය නොවන ප්‍රවාහන සේවාවන් තුලින් ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, එක්සත් රාජධානිය සහ සියළු යුරෝපා ගමනාන්ත, ස්කැන්ඩිනේවියානු වරාය, රුසියානු වරාය, බ්‍රෙසීලය, මෙක්සිකෝව, දකුණු අප්‍රිකාව, ස්ලෝවේනියාව, යුක්රේනය, මධ්‍යධරණී රටවල්, අරාබි ගල්ෆ් **ප්‍රදේශය ඇත පෙරදිග, නැගෙනහිර ආසියාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය සහ ඉන්දියානු උප මහාද්වීපික වරායන් යනාදී ගමනාන්ත වලින් වූ නැව්බඩු ආනයන අවශ්‍යතා ඉටු කිරීමට සමාගමට හැකිවිය. තවද, පසුගිය වසරට සාපේක්ෂකව අදාල වර්ෂය** තුලදී විසිරි තොග හා **Pure** Car ධාරිතාවන්ට අදාල මෙහෙයුම් කටයුතු තුන්ගුණයකින් පමණ වැඩිවිය. කෙසේ නමුත් LCL නැව් බඩු තොග හා TEU මෙහෙයුම් කටයුතු ඉහත වර්ෂය සමඟ සසඳා බලන කල පිළිවෙලින් 25.93% සහ 20.88% කින් අඩුවී තිබේ.

සමාලෝචනයට අදාල කාලය වූ කලී ලංකා නැව් සංස්ථාව සහ Lanka Coal Company (Pvt) Ltd. සමාගම අතර 2010 වර්ෂයේදී එලඹි පළමු ගිවිසුමෙන් ඉක්බිතිව නාවික භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ ගිවිසුම අත්සන් කල තෙවැනි වතාව වන අතර මෙම ගිවිසුම අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ "ලක්විජය" තාප බලාගාරයට ගල්අඟුරු ප්‍රවාහනය කිරීම පිණිස 2014 මාර්තු දක්වා වලංගු වේ. නිරිත දිග මෝසම් කාලය හැර මාස හයේ විවෘත කාල පරිච්ඡේදය තුල ලංකා නැව් සංස්ථාවේ නැව් මගින් ගල්අඟුරු මෙ.ටොන් 761,281 ක් ප්‍රවාහනය කරන ලදී. මෙම වසරේ දී නිරීක්ෂණය වූ විශේෂ ලක්ෂණයක් වන්නේ පැරණි බත්තල් වෙනුවට ස්වයංප්‍රේරක බත්තල් යොදා ගැනීමය. මෙම පියවර පුත්තලම වරායේ ගල් අඟුරු ගොඩබෑම හා එහා මෙහා ගෙනයාමේ කටයුතුවල ඵලදායීතාවය ඉහල නංවා ගැනීමට පිටුවහලක් විය.

# <u>සී.ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය</u>
# <u>2012/2013</u>

**විගණන කමිටුවේ වාර්තාව**

**පත් කිරීම :**

යහ පාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්හි ක්‍රම පද්ධති පාලන කමිටු යනුවෙන් වූ 7 වෙනි පරිච්ඡේදයේ 7:4:1: විෂයාංකය ප්‍රකාරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් විගණක කමිටුව පත්කෙරිණි.

**විගණක කමිටුවේ කාර්යභාරය:**

විගණක කමිටුවේ කාර්යය හා වගකීම් පහත සඳහන් පරිදි වේ. මණ්ඩලයේ අනු කමිටුවක් ව,

- අදාල ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS) සහ අදාල නෛතික හා පාලනාත්මක නියමයන්ට අනුව මූල්‍ය වාර්තාකරණය සිදු කිරීම සහතික කිරීමේ කාර්යය සුපරීක්ෂණය කිරීමේදී විගණන කමිටුව, මණ්ඩලයට සහාය විය යුතුය.
- ව්‍යාපාරයේ උපකාරක සමාගම් සම්බන්ධයෙන් අදාල වන්නා වූ ප්‍රශ්ණගත කරුණු කිසිවක් වේ නම් විගණන කමිටුව විසින් ඒවා ක්‍රමික පදනමක් මත විසඳීමට පියවර ගත යුතුය.
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීම පිණිස විගණන කමිටුව මණ්ඩලයට සහය දිය යුතුය.
- අභ්‍යන්තර විගණකයන්ගේ අනවරත අපක්ෂපාතීත්වය හා ඔවුන්ගේ කාර්යක්ෂමතාවය විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබිය යුතුය.
- රජය විසින් නිකුත් කරනු ලැබ තිබෙන අදාල සියලු නීතිරීති, රෙගුලාසි සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේදැයි සහතික කිරීම සඳහා ඒවා නිරතුරුව සමාලෝචනය කිරීම හා අන්වේෂණය කිරීම සිදු කොට ඉන් ඉක්බිතිව, අනනුකූලව කටයුතු කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විගණන කමිටුව විසින් අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සහ රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ සමාලෝචනය කරනු ලැබීමෙන් ඉක්බිතිව ඒ සඳහා පිළියම් වශයෙන් ගන්නා ක්‍රියාමාර්ගවලදී මණ්ඩලයට සහාය දැක්විය යුතුය.
- කමිටුවේ නිරීක්ෂණ වාර්ෂික වාර්තාවලට ඇතුලත් කිරීම සඳහා ඒ පිළිබඳ වාර්තාවක් විගණන කමිටුව පිළියෙල කල යුතුය.
- රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලද, 2010.12.14 දිනැති අංක 55 දරණ යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, රාජ්‍ය ව්‍යවසායන් හි විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් සංග්‍රහයක් ලෙස භාවිතා කළ යුතුය.

**විගණන කමිටුවේ සංයුතිය:**

- මෙම කමිටුව,අඩුම තරමින් භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් ද අදාල රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා ඇතුළු විධායක බලතල නොමැති අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.
- විගණන කමිටුවේ සභාපතිත්වය, භාණ්ඩාගාර නියෝජිතයෙකු හෝ මූල්‍ය කළමනාකරණ කටයුතු පිළිබඳ නිපුනතාව සහිත තැනැත්තෙකු විසින් දැරීම වඩා යෝග්‍ය වේ.

- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ/බාහිර විගණක නියෝජිතයෙකු හෝ විගණන කමිටුවේ සේවය සඳහා අත්‍යාවශ්‍ය වන වෙනත් යම් තැනැත්තකු නිරීක්ෂක මට්ටමින් කටයුතු කිරීම සඳහා කැඳවිය හැකිය.

- අවශ්‍යවේනම් ආරාධනා කිරීම මඟින්, සාමාන්‍යාධිකාරී, මූල්‍ය කළමනාකරු සහ සෙසු ජ්‍යෂ්ඨ කළමනාකරුවන්ට විගණන කමිටුවට සහභාගී වීමට හැකි වන පරිදි කටයුතු පිළියෙල කල යුතුය.

- අදාල වාර්තා ආදිය ද ඉදිරිපත් කිරීම ආදිය මඟින් අභ්‍යන්තර විගණන වරයා විගණක කමිටුව විසින් තීරණ ගනු ලැබීමේදී සහය දැක්විය යුතු අතර,අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් ලෙස කටයුතු කල යුතුය.

**රැස්වීම්**

- විගණන කමිටුව යටත් පිරිසෙයින් මාස 03 කට වතාවක්වත් රැස්විය යුතු අතර, එකී රැස්වීමට සියළු කමිටු සාමාජිකයන් සහභාගී විය යුතු වේ.
- රැස්වීම් න්‍යාය පත්‍ර පිළියෙළ කරනු ලබන අතර, විස්තර පත්‍රිකා සමඟ ඒවා සාමාජිකයින්ට කල්වේලා ඇතිව බෙදා හරිනු ලබන අතර, විගණන කමිටු තීරණ ක්‍රමානුකූලව සටහන් කොට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්තා කරනු ලැබේ.

**සමාලෝචන:**

අදාල වර්ෂයේදී විගණන කමිටුව විසින් පහත දැක්වෙන දේ සමාලෝචනයට භාජනය කරන ලදී.

- විගණන වැඩසටහන - 2013
- අභ්‍යන්තර පාලන පද්ධතිය - 2013
- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් භාවිතා කිරීම සඳහා සූදානම්වීමේ සාකච්ඡාව (SLFRS)
- 2010/11 සහ 2011/12 වියදම් පිළිබඳ වාර්තාව සමාලෝචනය කිරීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක SP/CS/30/12 දරණ චක්‍රලේඛනය සමාලෝචනය කිරීම හා සාකච්ඡා කිරීම.

**නිගමනය:**

විගණන කමිටුවේ නිර්දේශ යෝජනා අනුව අදාල කටයුතු සිදුකරන්නේදැයි තහවුරු කරගනු පිණිස ප්‍රමාණවත් ලෙස පසුවිපරම් ක්‍රියා පරිපාටින් අනුගමනය කරනු ලැබේ.

කමිටුව වෙනුවෙන්,

**අජිත් අබේසේකර**
විගණන කමිටුවේ සභාපති

## සී/ස. ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය
## 2012/2013
## තුති ප්‍රණාමය

ගරු මහාමාර්ග, වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් සංස්ථාව වෙත නිරතුරුවම පළකරන ලද පූර්ණ සහයෝගය, උපදේශනය සහ දිරිගැන්වීම වෙනුවෙන් එතුමාට අපගේ ස්තුති ප්‍රණාමය සුදකර සිටිමු.

සංස්ථාවේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමෙහිලා දැක්වූ සහයෝගය සහ අනුබලය වෙනුවෙන් මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ නිලධාරී මහත්ම මහත්මීන්ට සංස්ථාවේ ස්තුතිය මෙයින් පිරිනැමේ.

සෑම අවස්ථාවකදීම සලසා දෙන ලද ආධාර හා අනුබලය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියටද, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවටද, විදේශීය නැව් නියෝජිත ආයතන වෙත ද අපගේ ස්තුති ප්‍රශංසාව මෙහිදී පිරිනමනු ලැබේ.

## කාර්ය මණ්ඩලයට ස්තුතිය

සමාලෝචිත වර්ෂය තුල සංස්ථා පාලනාධිකාරියේ සහ සේවක සේවිකාවන් අතර සබඳතාවය නොකඩවා වැඩිදියුණු වූ අතර සංස්ථාවේ කටයුතු කෙරෙහි සියළුදෙනාගේම සුහදතාවය හා සහයෝගය ලැබුණි. සේවක සංගම් ද සංස්ථාවේ පාලනාධිකාරිය සමඟ දැඩි වගකීමෙන් හා එකමුතුභාවයෙන් කටයුතු කළේය.

නාවික කර්මාන්තය මුහුණ දී ඇති දැඩි අවපාතය හමුවේ නොසැලී සිටිමින් ස්වකීය කටයුතු කරගෙනයාමට සංස්ථාවට හැකිවනු පිණිස දැඩි කැපවීමෙන්, අවංක හා පක්ෂපාතී බවින් තම සේවා සලසා දුන් යාන්ත්‍රික හා ගොඩබිම් කාර්ය මණ්ඩලය යන දෙපාර්ශවය වෙනුවෙන් ශ්‍රී ලංකා නැව් සංස්ථාව තම ස්තුති ප්‍රණාමය පිරිනමයි.

තවද, සංස්ථාවේ සේවාවන් ලබාදීමේදී සහයෝගය පලකල සියළුම ගනුදෙනුකාර භවතුන්ට සී/ස. ලංකා නැව් සංස්ථාව සිය කෘතවේදීත්වය පළකරයි.

## ටී ඇන්ඩ් ඩී ඇසෝසියේට්ස් සමාගම
## වරලත් ගණකාධිකාරීවරු

**ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**
සී/ස. ලංකා නැව් සංස්ථාවේ කොටස් හිමියන් වෙත,

**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව**

සී/ස. ලංකා නැව් සංස්ථාව (සමාගම) ට අයත් මීට යා කොට ඇති 2013 මාර්තු 31 දිනට පැවති ශේෂ පත්‍රය එකී වර්ෂාවසාන සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය සහ කොටස් ස්කන්ධ වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ, කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශයන් සහ අනෙකුත් පැහැදුම් සටහන් ද අප විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට සාධාරණ අයුරින් ඉදිරිපත් කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ. වංචා හා ප්‍රමාද දෝෂ හේතු කාරක වී තිබුනද, නොතිබුනද වැදගත් අවප්‍රකාශවලින් තොරව අදාල මූල්‍ය ප්‍රකාශ පිළියෙලකොට සාධාරණව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාම යනාදී කරුණු ද, ප්‍රශස්ත ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම යන කරුණුද ඊට ඇතුලත් වේ.

**විගණනයේ විෂය පථය හා මතයට පාදක වූ කරුණු:**

අපගේ වගකීම වන්නේ අප විගණනය පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් පළ කිරීමය. පහත සඳහන් ඡේදවල සාකච්ඡා කර ඇති කරුණු හැරුණු විට අපගේ විගණනය ඉටුකර ඇත්තේ ශ්‍රී ලංකා විගණන ප්‍රතිපත්තිවලට අනුකූල අයුරිනි. අදාල මූල්‍ය ප්‍රකාශ සැලකිය යුතු අවප්‍රකාශවලින් තොරව පවතින්නේ ද නොපවතින්නේ ද යන්න පිළිබඳව විගණනය සැලසුම්කොට ක්‍රියාවට නැංවීම යන කරුණු එකී ප්‍රමිතීන්ගෙන් අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශවල අගයන් සහ හෙළිදරව් කිරීම්වල උපකාරක සාක්ෂි සෝදිසි පදනමක් මත පරීක්ෂා කිරීම විගනණයකට ඇතුළත් වේ. කළමනාකරණය විසින් භාවිත කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හා කැපී පෙනෙන ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන් ම මූල්‍ය ප්‍රකාශවල සමස්ත ඉදිරිපත් කිරීම අගැයීමේ කාර්යය ද විගණනයට ඇතුළත් වේ.

මතය දක්වා ඇති පහත සඳහන් ඡේදයේ සාකච්ඡා කරනු ලැබ ඇති කරුණු හැරුනුකොට අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් ලබා ගතිමු. එබැවින්, අපගේ විගණනය තුලින් අපගේ මතය සාධාරණ අයුරින් පිළිබිඹුවන්නේ යයි අප විශ්වාස කරමු.

**මතය:**

අපගේ මතයට අනුව මේ දක්වා අපගේ පරීක්ෂණවලින් පෙනීයන පරිදි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගම විසින් 2013 මාර්තු 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බවත් එකී වර්ෂය අවසානයට සමාගමට අදාල මූල්‍ය ප්‍රකාශවලින් සහ සමාගමේ, ලාභ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් 2013 මාර්තු 31 වනවිට සමාගමේ කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ මතයක් පිළිබිඹුවන බවත් කිව හැකිය.

ස්වකීය උපකාරක සමාගමක් වන ෂිපිං ඒජන්සි (පෞද්ගලික) සමාගම සම්බන්ධයෙන් වන විගණන කටයුතු තවමත් ඒකාබද්ධ කොට නොමැති හෙයින් සහ එය ක්‍රියාත්මක නොවෙමින් තිබෙන ආයතනයක් බැවින් එහි මූල්‍ය ප්‍රකාශ කිරීමකින් තොරව අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

ඉහත ඡේදයේ පැහැදිලිකොට ඇති හේතු අනුව, ඒකාබද්ධ කිරීමේ කාර්යයෙන් වැලකී සිටිනු පිණිස 2007 අංක 07 දරණ සමාගම් පනතේ 153(7) වගන්තිය ප්‍රකාරව සංස්ථාව විසින් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙතින් අවශ්‍ය අනුමැතිය අයැද තිබේ. ඒ අනුව, එකී ආයෝජන, පිරිවැය පදනමක් මත ගණනය කරනු ලැබේ.

**වෙනත් නෛතික හා පාලනාත්මක නියමයන් පිළිබඳ වාර්තාව**

2007 අංක 07 දරණ සමාගම් පනතේ 153(6) වගන්තිය හැරුනු කොට මෙහි මූල්‍ය ප්‍රකාශ එම පනතේ 152(2) වගන්තියේ සඳහන් නියමතාවන් සමඟද අනුකූල වන බව අපගේ මතය වේ.

අත්.කළේ.

ටී.ඇන්ඩ්.ඩී. ඇසෝසිඒට්ස් සමාගමේ
වරලත් ගණකාධිකාරීවරුන්
2013 නොවැම්බර් 13 දින
කොළඹ දීය.

## මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් වාර්තාව

| | සටහන | 2013 | 2012 |
|---|---|---|---|
| ආදායම | 6 | 850,732,686 | 339,091,211 |
| සෘජු මෙහෙයුම් වියදම | | (539,088,718) | (170,069,243) |
| දළ ලාභය | | **311,643,968** | **169,021,968** |
| වෙනත් ආදායම් | 7 | 48,218,207 | 27,940,317 |
| පරිපාලන වියදම් | | (145,944,235) | (143,777,618) |
| මෙහෙයුම්වලින් ලාභය | | **213,917,940** | **53,184,667** |
| ශුද්ධ මූල්‍ය ආදායම | 8 | 30,405,262 | 21,562,599 |
| ආශ්‍රිත සමාගම්වල ශුද්ධ බදු සහිත ලාභය | 15.1 | 21,387,767 | 18,954,260 |
| බද්දට පෙර ලාභය | 9 | **274,710,969** | **93,701,526** |
| ආදායම් බදු වියදම් | 10 | (55,918,925) | (9,492,978) |
| වර්ෂය සඳහා ලාභ | | **218,792,044** | **84,208,548** |
| | | ========== | ======== |
| කොටසක් සඳහා මූලික ඉපැයීම් | 11 | **43.76** | **16.84** |
| වෙනත් සවිස්තරාත්මක ආදායම් | | | |
| වර්ෂය සඳහා ලාභය | | 218,792,044 | 84,208,548 |
| විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්වලින් ශුද්ධ ලැබීම්/පාඩු | 17.1 | (6,368,110) | (4,531,614) |
| අනෙකුත් සවිස්තරාත්මක ආදායම් එකතුව | | **(6,368,110)** | **(4,531,614)** |
| වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් එකතුව | | **212,423,934** | **79,676,934** |
| | | ========= | ======== |

වරහන් තුල ඇති සංඛ්‍යාවන්ගෙන් අඩුකිරීම් දැක්වේ. අංක 7 සිට 34 දක්වා පිටුවල සඳහන් ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

## මාර්තු 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| වත්කම් | සටහන | 2013 | 2012 | 2011 අප්‍රේල් 01 දිනට |
|---|---|---|---|---|
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපොල, පිරියත හා උපකරණ | 12 | 72,858,715 | 67,098,342 | 56,764,726 |
| ස්පර්ශනීය නොවන වත්කම් | 13 | - | - | - |
| පාලිත සමාගම්හි ආයෝජන | 14 | - | - | - |
| ආශ්‍රිත සමාගම්හි ආයෝජන | 15 | 217,970,518 | 196,912,331 | 178,287,651 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | 17 | 37,827,808 | 44,195,918 | 48,727,532 |
| විලම්භිත බදු වත්කම් | 18 | 3,180,367 | 17,875,603 | 19,490,383 |
| ජංගම නොවන මුළු වත්කම් | | **331,837,408** | **326,082,194** | **303,270,292** |
| **ජංගම වත්කම්** | | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | | 2,221,735 | 2,144,023 | 845,359 |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | 19 | 1,154,149,173 | 769,946,972 | 367,097,338 |
| ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත | 20 | 38,140,327 | 34,660,965 | 48,387,267 |
| කල්පිරීම් ආයෝජන | 21 | 131,700,530 | 93,430,380 | 154,204,954 |
| කෙටිකාලීන ආයෝජන | 22 | 205,054,559 | 179,708,322 | 397,197,981 |
| මුදල් හා මුදල් සාමාන්‍යයන් | 23 | 73,186,619 | 63,498,493 | 244,563,834 |
| මුළු ජංගම වත්කම් | | **1,604,452,943** | **1,143,389,155** | **1,212,296,733** |
| විකිණීම සඳහා රඳවා ගන්නා ලද වත්කම් | 24 | 12,326,800 | 12,326,800 | - |
| **මුළු වත්කම්** | | **1,948,617,151** | **1,481,798,149** | **1,515,567,025** |
| | | ========== | ========== | =========== |
| **කොටස් ස්කන්ධ හා බැරකම්** | | | | |
| **කොටස් ස්කන්ධය** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 25 | 50,000,000 | 50,000,000 | 50,000,000 |
| කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය | 26 | 562,017,353 | 575,541,087 | 515,541,087 |
| විකිණීම සඳහා තිබෙන මූල්‍ය වත්කම් සංචිතය | - | 32.347,616 | 38,715,726 | 43,247,340 |
| **ප්‍රාග්ධන සංචිත** | 27 | 767,029,765 | 767,029,765 | 767,029,765 |
| ප්‍රත්‍යාගණන සංචිත | 28 | 18,796,336 | 18,796,336 | 18,796,336 |
| රඳවාගත් ඉපැයීම්(හර) | | (447,018,426) | (676,744,559) | (760,953,107) |
| **මුළු කොටස් ස්කන්ධය** | | **983,172,644** | **773,338,355** | **633,661,421** |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන් | 29 | 18,315,468 | 21,941,868 | 23,624,285 |
| මුළු ජංගම නොවන බැරකම් | | **18,315,468** | **21,941,868** | **23,624,285** |
| **ජංගම බැරකම්** | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | 30 | 874,692,411 | 642,776,451 | 841,894,736 |
| ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත | 31 | 69,154,628 | 35,220,888 | 7,491,152 |
| උපචිත වියදම් | 32 | 3,282,000 | 3,174,938 | 3,727,117 |
| බැංකු අයිරා | 23 | - | 5,345,649 | 5,168,314 |
| මුළු ජංගම බැරකම් | | 947,129,039 | 686,517,926 | 858,281,319 |
| **මුළු කොටස් ස්කන්ධ හා බැරකම්** | | **1,948,617,151** | **1,481,798,149** | **1,515,567,025** |
| | | =========== | ========== | ========== |

වරහන්තුල ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ. අංක 7 සිට 34 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසක් නියෝජනය කරයි.

මෙම මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරණ සමාගම් පනතේ නියමතාවන්ට අනුකූල වන පරිදි වේ.

------------------------------

**මූල්‍ය කළමනාකරු**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කොට ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. සී/ස. ලංකා නැව් සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමතකොට අත්සන් තබන ලදී.

------------------------------ ------------------------------

**අධ්‍යක්ෂ** **අධ්‍යක්ෂ**

2013 නොවැම්බර් මස 13 දින.

**කොටස් ආයෝජන වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය 2013 මාර්තු 31 දිනට**

| | සටහන | ප්‍රකාශිත ප්‍රාග්ධනය | කොටස් ප්‍රාග්ධනය සඳහා දායකත්වය | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | විකිණීමට ඇති මූල්‍ය වත්කම් සංචිතය | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 2011 අප්‍රේල් 01 දිනට ශේෂය (මුලින් සඳහන් කළ) | 39 | 50,000,000 | 515,541,087 | 880,754,607 | - | - | (1,147,110,046) | 299,185,648 |
| පළමුවරට SLFRS යොදා ගැනීමෙන් ඇතිවූ බලපෑම | 39 | - | - | (113,724,842) | 18,796,336 | 43,247,340 | 386,156,939 | 334,475,773 |
| 2011 අප්‍රේල් 01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත) | 39 | **50,000,000** | **515,541,087** | **767,029,765** | **18,796,336** | **43,247,340** | **(760,953,107)** | **633,661,421** |
| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන | - | | 60,000,000 | - | - | - | - | 60,000,000 |
| වසර සඳහා ලාභය | - | - | - | - | - | - | 84,208,548 | 84,208,548 |
| වෙනත් සවිස්තරාත්මක ආදායම් | - | - | - | - | - | (4,531,614) | - | (4,531,614) |
| 2012 මාර්තු 31 දිනට ශේෂය | | **50,000,000** | **575,541,087** | **767,029,765** | **18,796,336** | **38,715,726** | **(676,744,559)** | **773,338,355** |
| වසර සඳහා ලාභය | | - | - | - | - | | 218,792,044 | 218,792,044 |
| වෙනත් සවිස්තරාත්මක ආදායම් | - | | | | | 6,368,110 | - | 6,368,110 |
| සම්පූර්ණයෙන් ක්ෂයගත කරන ලද වත්කම් නැවත ප්‍රකාශ කිරීම | 12 | - | - | - | - | - | 10,934,089 | 10,934,089 |
| ලැබූ ප්‍රදාන ආපසු ගෙවීම් | | - | (13,523,734) | - | - | - | - | (13,523,734) |
| 2013 මාර්තු 31 දිනට ශේෂය | | **50,000,000** | **562,017,353** | **767,029,765** | **18,796,336** | **32,347,616** | **(447,018,426)** | **983,172,644** |
| | | ======== | ========= | ========= | ======== | ======== | =========== | ========= |

## සී/ස. ලංකා නැව් සංස්ථාව

## මාර්තු 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2013 | 2012 |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | |
| බද්දට පෙර ලාභය | | 274,710,969 | 93,701,526 |
| **ගැලපුම්** | | | |
| ක්ෂයවීම් | | 4,166,202 | 3,767,523 |
| දේපොල,පිරියත හා උපකරණ විකිණීමෙන් (ලාභය/අලාභය) | | (710,043) | (262,750) |
| වර්ෂය සඳහා පාරිතෝෂික | | 805,230 | 931,858 |
| දේපොල, පිරියත හා උපකරණවල වටිනාකම් හීනවීම සඳහා ප්‍රතිපාදන | | 3,626,440 | - |
| ලාභාංශ ආදායම | | (337,959) | (718,907) |
| බදු ඇතුළුව ආශ්‍රිත සමාගම්හි ලාභයේ කොටස් | | (21,387,767) | (18,954,260) |
| පොලී ආදායම | | (39,447,836) | (23,954,821) |
| පොලී වියදම් | | 42,574 | 2,392,222 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය | | **221,467,810** | **56,902,391** |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | |
| වට්ටෝරුගත භාණ්ඩ | | (77,712) | (1,298,665) |
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | | (384,202,200) | (402,849,635) |
| ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත | | - | 8,519,638 |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | | 231,915,960 | (199,118,285) |
| ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත | | (7,289,950) | 27,233,467 |
| උපචිත වියදම් | | 107,062 | (552,179) |
| මෙහෙයුම්වලදී භාවිත කළ/ජනිත මුදල් | | **61,920,970** | **(511,163,268)** |
| ගෙවූ පාරිතෝෂිත | | (4,431,630) | (2,614,275) |
| ගෙවූ පොලිය | | (42,574) | (2,392,222) |
| ගෙවූ බදු | | (3,479,361) | (2,175,265) |
| මෙහෙයුම් තුල භාවිත කල/ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය | | **53,967,405** | **(518,345,030)** |
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | | | |
| දේපොල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | | (2,645,124) | (22,896,115) |
| දේපොල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | | 736,241 | 262,750 |
| සිදුකෙරෙමින් පවත්නා වැඩ සඳහා දරන ලද වියදම් | | - | (3,531,824) |
| කල්පිරීම් සහිත මූල්‍ය වත්කම්හි ආයෝජන | | (145,363,635) | (87,791,422) |
| කල්පිරීම් සහිත මූල්‍ය වත්කම්හි කල්පිරීම් | | 107,846,479 | 147,761,559 |
| කෙටි කාලීන මූල්‍ය වත්කම් කල්පිරීම් | | - | 228,535,500 |
| ලැබුණු පොලිය | | 13,348,605 | 13,713,417 |
| ලැබූ ලාභාංශ | | 667,540 | 1,048,487 |
| **ආයෝජන කටයුතුවලින් ජනිත/යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(25,409,894)** | **277,102,352** |

**මූල්‍ය කටයුතු වලින් ජනිත මුදල් ප්‍රවාහ**

| | | | |
|---|---|---|---|
| භාණ්ඩාගාරයෙන් ලද (ආපසු ගෙවීම්) ප්‍රදාන | | (13,523,734) | 60,000,000 |
| **මූල්‍ය සම්පාදන කටයුතුවලින් ජනිත/යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(13,523,734)** | **60,000,000** |
| **වර්ෂය තුල මුදල් හා මුදල් සාමානයන්හි ශුද්ධ වෙනස්කම්** | | 15,033,777 | (181,242,678) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සාමානයන් | | 58,152,842 | 239,395,520 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සාමානයන් | 23 | **73,186,619** | **58,152,842** |
| | | ======== | ========= |

වරහන්තුල ඇති සංඛ්‍යාවන්ගෙන් අඩුකිරීම් දැක්වේ. අංක 7 සිට 34 දක්වා පිටුවල දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටස් නියෝජනය කරයි.

## 2. කැපී පෙනෙන ගිණුම් ප්‍රතිපත්ති සම්පිණ්ඩනය

### 2.1 පිළියෙල කිරීම් පදනම

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව (SLFRS) පිළියෙල කරනු ලැබ ඇති අතර විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් ගණයෙහි ලා සලකන ලද ලැයිස්තුගත ආයෝජනයන්හි සාධාරණ මිල අනුව සංශෝධනය කරන ලද ඓතිහාසික පිරිවැය ක්‍රමය ඊට භාවිතා කරනු ලැබ තිබේ. දේපොල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී ඓතිහාසික පිරිවැය ක්‍රමය භාවිතයට ගෙන තිබේ. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් (SLFRS) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඇතැම් අත්‍යාවශ්‍ය ගිණුම් ඇස්තමේන්තු භාවිතයට ගැනීම අවශ්‍ය කෙරේ. තවද, ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය විසින් තම තීරණය ක්‍රියාවේ යෙදවීමද එයින් අපේක්ෂා කෙරේ. අංක 4 දරන සටහන මගින් මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් උපකල්පන හා ඇස්තමේන්තු කැපීපෙනෙන්නාවූ අවස්ථාවන්හි දී සුවිශේෂී වූ තීරණ හෝ සංකීර්ණතාවන් අඩංගුවන ක්ෂේත්‍ර මොනවාදැයි යන්න පැහැදිලි කෙරේ.

2012 මාර්තු 31 දිනෙන් අවසන් වූ වාර්තා කිරීමේ කාලය ඇතුලත් ඉහත කාල පරිච්ඡේදය සඳහා සමාගම විසින් මූල්‍ය ප්‍රකාශ පිළියෙලකොට තිබෙන්නේ 2011 දෙසැම්බර් 31 දින දක්වා වලංගු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිද්දෙනි. සමාගමේ මෙවර මූල්‍ය ප්‍රකාශ වූ කලී පළමුවරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) ප්‍රකාරව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ය. මෙසේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs) අනුගතවීම සහ සමාගම සම්බන්ධයෙන් මීට ඉහතදී වාර්තා කරන ලද මූල්‍ය තත්ත්වයන් හා මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි බලපෑම්, මූල්‍ය ප්‍රකාශ සඳහා වූ 39 වැනි සටහනෙන් පැහැදිලි කරනු ලැබ ඇත.

### 2.2 ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්කම්

වෙනත් යම් ආකාරයකින් සඳහන් කොට ඇත්තේනම් මිස පහත දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්තිමය සංශෝධන අනවරත අයුරින් සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශවලින් ඉදිරිපත් කරන ලද කාලපරිච්ඡේද සඳහා සහ ගිණුම්කරන ප්‍රමිතීන්ට මාරුවීමේ දිනට වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLFRS) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ආරම්භයට යොදාගෙන තිබේ.

ඉහත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා වර්ගීකරණය කිරීමේ පිළිවෙල අදාල තන්හිදී සංශෝධනය කරනු ලැබ ඇත්තේ ප්‍රශස්ත අයුරින් ඉදිරිපත් කිරීම උදෙසා මෙන්ම ප්‍රවර්තන වර්ෂයේ ප්‍රකාශ සමඟ තුලනාත්මක වීම සඳහාය.

### 2.3 ආශ්‍රිත සමාගම්හි ආයෝජන

ආශ්‍රිත සාමාගම් යනු කැපී පෙනෙන පාලනය නොව කැපීපෙනෙන බලපෑමක් කළ හැකි වූ ද ඍජුව හෝ වක්‍රව සමාගම් විසිපහක හෝ ඊට වැඩි ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය සතු අස්ථිතීන්ය. ආශ්‍රිත සමාගම්වල ආයෝජන ගණන්ගනු ලබන්නේ ස්කන්ධ ගිණුම් ක්‍රමය අනුවය. මෙම ක්‍රමය යටතේ ආයෝජන මූලිකව හඳුනාගනු ලබන්නේ පිරිවැය අනුව වන අතර අත්පත් කරගැනීමේ දිනට ඉක්බිතිව ආයෝජන ලාභියාගේ ලාභය හෝ පාඩුව තුල ආයෝජකයාගේ කොටස හඳුනාගැනීම සඳහා ඉදිරියට ගෙනයන මුදල වැඩි කිරීම හෝ අඩුකිරීම සිදුකරනු ලැබේ.

අත්පත් කර ගැනීමෙන් අනුතුරුව ලැබෙන, සමාගමේ ලාභයේ කොටස හෝ පාඩුවේ කොටස සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනෙන අතර ආයෝජන ලාභියාගේ සෙසු සවිස්තරාත්මක ආදායම්හි දැක්වෙන පශ්චාත් අත්පත් කර ගැනීම් සංචලනයන් ආයෝජනයේ ඉදිරියට ගෙනයන මුදලට අනුරූප සීරුමාරු කිරීම් සහිතව වෙනත් සවිස්තරාත්මක ආදායම් තුල හඳුනා ගැනේ.

එක් එක් වාර්තා කිරීමේ දිනය වනවිට ආශ්‍රිත සමාගම්වල කරනු ලැබ ඇති ආයෝජන අපවය වීම පිළිබඳ විෂයානුබද්ධ සාක්ෂි ඇත්දැයි යන්න තීරණය කරනු ඇත. එසේ වන්නේ නම් සමාගම විසින් අපවයට අදාල වටිනාකම් ගණනය කරනු ලබන්නේ ආශ්‍රිත සමාගම්හි අයකරගත හැකි මුදල හා එහි ඉදිරියට ගෙනයන වටිනාකමේ වෙනසයි.

සමාගමේ වෙන්වෙන් මූල්‍ය ප්‍රකාශයන්හි ආශ්‍රිත සමාගම විසින් ආශ්‍රිත සමාගම්වල කෙරෙන ආයෝජන, සමුච්චිත අපමය පාඩු කිසිවක් ඇත්නම් ඒවා අඩුකොට මූලික පිරිවැය අනුව ගණනය කරනු ලැබේ.

## 2.4 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

### 2.4.1 කාර්යීය හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් ගණුදෙනු හා ශේෂයන් මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරය තුල ව්‍යවහාරවන මුදල් ඒකකය භාවිතා කිරීමෙනි. ශ්‍රී ලංකා රුපියල අනුව මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කෙරේ. මෙය සමාගමේ ඉදිරිපත් කිරීම් සඳහා යොදාගනු ලබන ව්‍යවහාර මුදල් ඒකකයයි.

### 2.4.2 ගනුදෙනු හා ශේෂ

විදේශ විනිමය ගනුදෙනු කාර්යීය ව්‍යවහාර මුදලට පරිවර්තනය කරනු ලබන්නේ ගනුදෙනු සිදුවන දිනයන්හිදී ක්‍රියාත්මකව පවතින විණිමය අනුපාතික යොදා ගැනීමෙනි. එවැනි ගනුදෙනු නිරවුල් කිරීම තුලින් විදේශ විනිමය ලැබීම් හා පාඩුවල ප්‍රතිඵලයක් වශයෙන් සහ විදේශ විනිමය විදේශ ව්‍යවහාර මුදල් බලපවත්වන මූල්‍ය වත්කම් හා වගකීම්වල වසරාවසාන විනිමය අනුපාතයන් පරිවර්තනයන් තුලින් ලැබෙන විදේශ විනිමය ලැබීම් හා පාඩු සවිස්තරාත්මක ආදායම්, ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

ක්‍රමකාලය පිරිවැය සම්බන්ධයෙන් වන පරිවර්තන වෙනස්කම් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුලින් පෙන්නුම් කෙරේ.

## 2.5 දේපොල, පිරියත හා උපකරණ

දේපොල, පිරියත හා උපකරණ ගිණුම් ප්‍රකාශ තුල හඳුනා ගනු ලබන්නේ දේපොල ඒවා පවතින ස්ථානයට රැගෙන ඒමේ දී සහ කළමනාකාරිත්වය විසින් ඒවා තමන්ට අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තත්ත්වයන් යටතේ දැරීමට කිසියම් පිරිවැයක් වේනම් ඒවාද ඇතුළුව මූලිකව දැරීමට සිදුවූ පිරිවැය අනුවය.

2011 මාර්තු 31 දිනට ප්‍රථම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති ප්‍රකාරව පිළියෙල කරනු ලබන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි දැක්වෙන්නේ ප්‍රත්‍යාගණනය කළ දේපොල, පිරියත හා

උපකරණවල වටිනාකමිය.  සමාගම විසින් එබඳු ප්‍රත්‍යාගණනය කළ මුදල් ප්‍රමාණයන් සලකනු ලබන්නේ ප්‍රත්‍යාගණනය කළ දිනට විය හැකියයි සැලකෙන පිරිවැය වශයෙනි. ඒ අනුව, දේපොල, පිරියත හා උපකරණවල (සමුච්චිත ක්ෂයවීම් හා කිසියම් සමුච්චිත අපචය පාඩු කිසිවක් ඇත්නම් ඒවාද අඩුකොට) උද්දේශික පිරිවැය දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඉක්බිතිව අත්පත්කරගත් දේපොල, පිරියත හා උපකරණ (සමුච්චිත ක්ෂයවීම් හා කිසියම් සමුච්චිත අපචය පාඩු කිසිවක් ඇත්නම් ඒවා අඩුකොට) ඓතිහාසික පිරිවැය අනුව සඳහන් කරනු ලැබේ.

දෙවනු පිරිවැය, දේපොලෙහි ඉදිරියට ගෙනයන වටිනාකමට ඇතුලත් කිරීම හෝ වත්කමක් වශයෙන් හඳුනා ගැනීම සිදු කෙරෙන්නේ එකී භාණ්ඩ විෂයෙන් අනාගතයේදී සමාගමට ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙන්නේ නම් සහ භාණ්ඩ විෂයේ පිරිවැය විශ්වාසකළ හැකි අයුරින් ගණනය කළ හැකිනම් පමණි. සෙසු සියළු අළුත්වැඩියා කිරීම් හා නඩත්තු කිරීම් සඳහා වියදම් දැරූ වර්ෂයේ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයට ඇතුලත් කෙරේ.

ඉඩම් සම්බන්ධයෙන් ක්ෂයවීම් ගණනය නොකෙරෙන අතර වත්කම්වල ක්ෂයවීම් ගණනය කරනු ලබන්නේ ඒවායේ ප්‍රයෝජ්‍ය ආයුකාලය එල්ලේ සරල මාර්ග පදනම මතය.

| <u>වත්කම් ගණය</u> | <u>වර්ෂ</u> | |
|---|---|---|
| නෞකා | අවු. | 10 |
| බහාළුම් | අවු. | 10 |
| ගොඩනැගිලි | අවු. | 20 |
| මෝටර් වාහන | අවු. | 04-10 |
| ගරාජය | අවු. | 10 |
| පරිගණක | අවු. | 05 |
| ලී බඩු හා උපකරණ | අවු. | 10 |
| ස්ප්‍රෙඩර් යන්ත්‍ර | අවු. | 05 |

## 2.6 ස්පර්ශනීය නොවන වත්කම්

අත්පත් කර ගන්නා ලද පරිගණක මෘදුකාංග හා පාවිච්චියට සරිලන අයුරු විශේෂිත මෘදුකාංග හා ක්‍රම පද්ධති පිහිටුවීම සඳහා දරන ලද පිරිවැය පදනම් කරගෙන ඒවා ප්‍රාග්ධනීකරණය කෙරේ. අත්පත් කරගත් ස්පර්ශනීය නොවන වත්කම් සම්බන්ධයෙන් ගත්කල ඒවායේ පිරිවැය සමුච්චිත ක්‍රම ක්ෂය සහ සමුච්චිත අපමය පාඩු අඩුකිරීමෙන් ඉක්බිතිව සඳහන් කෙරේ. මෙකී පිරිවැය ඒවායේ ප්‍රයෝජ්‍ය ආයුකාලය අනුව පහත සඳහන් පරිදි ක්‍රමක්ෂය කෙරේ.

| | | |
|---|---|---|
| පරිගණක මෘදුකාංග | අවු. | 05 |

පරිගණක මෘදුකාංග නඩත්තු කිරීමේ සේවාවන් ආශ්‍රිත පිරිවැය දැරූ වියදමක් සේ හඳුනා ගැනේ.

## 2.7 විකිණීමට තිබෙන ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම් තවදුරටත් පාවිච්චි කිරීමට වඩා ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් මූලික වශයෙන් ඒවා විකිණීමෙන් ලබාගත හැකි වන්නේ නම් සමාගම මගින් ඒවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. විකිණීමට තිබෙන ජංගම වත්කම් මනිනු ලබන්නේ ඒවා විකිණීමට වැයවන පිරිවැය අඩු කිරීමෙන් ඉක්බිති ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සහ සාධාරණ වටිනාකම අනුවය. විකිණීමට තිබෙන්නා වූ යන වර්ගීකරණය සඳහා වූ නිර්ණායකය සපුරා ඇතිබව සැලකෙන්නේ විකිණීම අතිශයින්ම සම්භාවිත එකක් වීම හා වත්කම් පවතින ස්වභාවයෙන් වහා විකිණීම සඳහා පැවතීම වන කරුණුය. කළමනාකාරිත්වය විකිණීමේ ක්‍රියාව සඳහා කැපවිය යුතු අතර, විකිණීම සඳහා වර්ගීකරණය සිදුකොට වර්ෂයක් ඇතුලතදී එය අංග සම්පූර්ණ විකුණුම් ක්‍රියාවක් ලෙස හඳුනා ගැනීමට සුදුසුකම් ලබා තිබිය යුතුය. අයිතිකරුවන්හට විකිණීමට/බෙදාදීමට යනුවෙන් වර්ගකොට ඇති දේපොල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ක්ෂයවීම් හෝ ක්‍රමක්ෂය කිරීම් සිදු නොකෙරේ.

## 2.8 මූල්‍ය නොවන වත්කම් අපමය වීම

වාර්තා කිරීමේ අවසන් දිනය වනවිට සමාගම, දේපොල, පිරියත හා උපකරණ ස්පර්ශනීය නොවන වත්කම් සහ උපකාරක සමාගම්වල ආයේජනය කර ඇති දෑ සම්බන්ධයෙන් කිසියම් අපමය වීමක් සිදුවී ඇත්ද යන්න දැනගැනීම පිණිස ඉහත කී විෂයන්ගේ ඉදිරියට ගෙනයන වටිනාකම් සමාලෝචනය කරයි. එවැනි ඉඟියක් වේ නම් සමාගම විසින් එකී අපවයවීමේ පාඩුව තීරණය කිරීම් වස් වත්කමෙන් අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. කේවල වත්කමකින් මුදලක් අයකරගත හැකි/නොහැකි අවස්ථාවකදී සමාගම වත්කමට අයත් මුදල් උත්පාදනය කළ හැකි කොටස කුමක්දැයි තීරණය කරනු ලබන අතර, මුදල් අයකරගත හැකි එකී කොටස ඇස්තමේන්තු කරයි.

අයකරගතහැකි මුදල වූ කලී විකිණීමට අදාල පිරිවැය හා භාවිත අගය හැර සාධාරණ මිලට වඩා ඉහල එකකි. භාවිත අගය තක්සේරු කිරීමේදී, ඒවායේ වත්මන් වටිනාකමට වට්ටම් කෙරේ. ඊට මුදලේ කාලීන වටිනාකමේ ප්‍රවර්ථන වෙළඳපොල තක්සේරු කිරීමේ සහ ඉදිරි මුදල් ප්‍රවාහයන්හි ඇස්තමේන්තු සීරුමාරු නොකළ වත්කමට විශේෂිතවන අවදානම් පිළිබිඹු කෙරෙන බද්දට පෙර වට්ටම් කිරීමක් යොදා ගනු ලැබේ.

වත්කමක අයකරගත හැකි මුදල එහි ඉදිරියට ගෙනයන වටිනාකමට අඩුවෙන් ඇස්තමේන්තු කෙරේ නම් වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අයකරගත හැකි වටිනාකම දක්වා අඩු කෙරේ. අපවය පාඩුවක්, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

## 2.9 මූල්‍ය වත්කම්

### (අ) වර්ගීකරණය

මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගකිරීම සමාගම විසින් නිර්ණය කරනු ලබන්නේ පහත සඳහන් අයුරිනි.

i. ණය සහ ලැබීම් නියමිත
ii. විකිණීමට ඇති මූල්‍ය වත්කම්
iii. කල්පිරීම් ආයෝජනවල ඇති මුදල්

### i. ණය හා ලැබීම් නියමිත

ණය හා ලැබීම් නියමිත වූ කලී, සක්‍රිය වෙළඳපොලේ ලැයිස්තුගත නොකරන ලද ස්ථිර හෝ නිර්ණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවූ ඒවාය. ජංගම නොවන වත්කම් ලෙස වර්ග කොට ඇති වාර්තා කිරීමේ කාලසීමාව අවසන්වන විට මාස 12 ට වැඩි කල්පිරීම් සහිත ආයෝජන හැර ණය සහ ලැබීම් නියමිත, ජංගම වත්කම්වල ඇතුලත් කරනු ලැබේ. සමාගමේ ණය හා ලැබීම් නියමිත සමන්විත වන්නේ වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත, කාලීන තැන්පතුවල ඇති ආයෝජන, තැන්පතු හා අත්තිකාරම් වාර්තා කිරීමේ දිනය අවසන් වන විට පැවති මුදල් සහ මුදල් සාම්‍යයන්ය.

### ii. විකිණීමට ඇති මූල්‍ය වත්කම්

විකිණීමට ඇති මූල්‍ය වත්කම් වූ කලී මෙම කාණ්ඩය යටතේ නම් කරන ලද හෝ වෙනත් කිසියම් කාණ්ඩයක් යටතේ වර්ග නොකරන ලද ව්‍යුත්පන්න ඒවා වේ. ආයෝජනය කල් නොපිරේ නම් හෝ වාර්තා කිරීමේ කාලය ඉකුත්වීමෙන් මාස 12 ක් ඇතුලත කළමනාකාරීත්වය විසින් එය සුදුස්සක් කොට බැහැර කිරීමට අදහස් නොකරන්නේ නම් ඒවා ජංගම-නොවන වත්කම්වල ඇතුලත් කරනු ලැබේ. විකිණීමට තිබෙන මූල්‍ය වත්කම් දිගුකාලීන ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවන කොටස් ආයෝජනවලින් සමන්විත වේ.

### iii. කල්පිරීම් ආයෝජන (HTM)

කල්පිරීම් ආයෝජන (HTM) වූ කලී ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ණය සහ ලැබීම් නියමිත නොවන්නා වූ ස්ථිර කල්පිරීම් ආයෝජනයන්ය. ආයෝජන HTM වශයෙන් වර්ගකරනු ලබන්නේ සමාගමට ඒවා කල්පිරෙන තෙක් ශුභවාදී අපේක්ෂාවක් හෝ හැකියාවක් තිබේ නම් පමණි. කල්පිරීමට තබා ඇති ආයෝජන ජංගම වත්කම්වල ඇතුලත් කෙරෙන්නේ ආයෝජන වසරකට වඩා කල්පිරීමට ඇති විටදීය. කල්පිරීමට ඇති HTM ආයෝජන, භාණ්ඩාගාර බිල්පත්වල කෙරුණු ආයේජනවලින් සමන්විත වේ.

### (ආ) හඳුනාගැනීම හා ප්‍රාරම්භක මැන බැලීම්.

සමාගම විසින් ගනුදෙනු පටන්ගන්නා දිනයේදී, ණය හා ලැබීම් නියමිත වශයෙන් වර්ගකරන ලද මූල්‍ය වත්කම් හඳුනාගනු ලැබේ. සෙසු මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් ගත්කල ඒවා හඳුනාගනු ලබන්නේ මූල්‍ය උපකරණ ගිවිසුම්ගත ආකාරයෙන් සැපයීම සඳහා සමාගම පාර්ශවයක් බවට පත්වූ **ව්‍යාපාරික දිනයේ** (Trade Date) සිටය.
මූල්‍ය වත්කමෙන් උද්ගතවන මුදල් ප්‍රවාහයන් ලබා ගැනීමට තිබෙන හිමිකම් ඉකුත්වන විට හෝ එකී හිමිකම් වෙනත් පාර්ශවයකට පවරනු ලබනවිට හා සමාගම විසින් සත්‍ය වශයෙන්ම එම මූල්‍ය වත්කම්වල හිමිකාරත්වයට අදාල වන සියළු අවදානම් හා ප්‍රතිලාභ සත්‍ය වශයෙන්ම පවරා දෙනු ලබන විට මූල්‍ය වත්කම් ප්‍රති හඳුනා ගැනීමක් සිදුකෙරේ.

### (ඇ) පසුව ගණනය කිරීම්

### i. ණය සහ ලැබීම් නියමිත

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් ඉක්බිතිව ණය හා ලැබීම් නියමිත, අපමයවීම් සඳහා වූ ප්‍රතිපාදන අඩුකිරීමෙන් ඉක්බිතිව සඵල පොලී අනුපාතිකය යොදාගෙන ක්‍රමක්ෂය පිරිවැය අනුව මැන බලනු ලැබේ.

### ii. විකිණීමට ඇති මූල්‍ය වත්කම් (AFS)

ප්‍රාරම්භක හඳුනාගැනීමෙන් ඉක්බිතිව, AFS යනුවෙන් වර්ගකොට ඇති ලැයිස්තුගත කොටස් ආයෝජන සාධාරණ වටිනාකම අනුව ගණනය ලැබේ. විකිණීමට ඇති මූල්‍ය වත්කමක සාධාරණ මිලෙහි සිදුවන වෙනස්කම් වෙ, ඒවායේ වත්මන් සාධාරණ වටිනාකම සහතික ලෙස ඇස්තමේන්තු කළ නොහැකි බැවින්, අපචය පාඩු අඩුකිරීමෙන් ඉක්බිතිව පිරිවැය අනුව ගණනය කෙරේ.

### iii. කල්පිරීම් ආයෝජන (HTM)

1. කල්පිරෙනතෙක් පවත්වාගෙන යන ආයෝජන ඉන් ඉක්බිතිව සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැය අනුව ගණනය කෙරේ. අත්පත් කරගැනීම් හා ගනුදෙනු පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ.

### (ඈ) මූල්‍ය වත්කම් අපමයවීම

### i. ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙනයන වත්කම්

එක් එක් වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේදී කිසියම් මූල්‍ය වත්කමක් අපචය වී ඇති බවට විෂය මූලික සාක්ෂි තිබේදැයි තක්සේරු කරනු ඇත. මූල්‍ය වත්කමක් සම්බන්ධයෙන් අපචයවීමක් සිදුවී අපමය පාඩු සිදුවන්නේ වත්කම පිළිබඳව ප්‍රාරම්භක හඳුනා ගැනීමෙන් පසුව සිදුවීමක් හෝ සිදුවීම් ගණනාවක් හේතුකොට ගෙන සිදුවී ඇති අපචයවීමක් සම්බන්ධයෙන් විෂය මූලික සාක්ෂි ඇත්නම් හා සහතික වශයෙන් ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහයන්ට එකී පාඩුවෙන් බලපෑමක් ඇතිවන්නේ නම් පමණි.

ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරියට ගෙන යනු ලැබූ ණය සහ ලැබීම් නියමිත පාඩුවී ඇති ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ඉදිරියට ගෙනයනු ලබන වටිනාකම සහ මූල්‍ය වත්කමේ මුල්ම සඵලදායී පොලී අනුපාතය අනුව වට්ටම් කරන ලද ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහයන් හි (නොදැරූ අනාගත ණය පාඩු හැර) වත්මන් අගය අතර ඇති වෙනසයි. මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම අඩුකරනු ලබන අතර පාඩුවූ මුදල සවිස්තර ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ. ඉක්බිතිවම එළඹෙන කාලපරිච්ඡේදයකදී අපචය පාඩුව අඩුවේ නම් හා අපචය හඳුනාගැනීමෙන් පසුව සිදුවූ කාරණාවකට එම අඩුවීම විෂය මූලික සම්බන්ධතාවයක් දක්වයි නම් කලින් හඳුනාගත් අපමය පාඩුවේ වෙනස්වීම සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

### ii. විකිණීමට ඇති මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් අපචය වී ඇත්දැයි යන්න සමාගම විසින් එක් එක් වාර්තා කිරීමේ කාලපරිච්ඡේදයක් අවසානයේදී තක්සේරු කර බලනු ලැබේ.

ලැයිස්තුගත කළ කොටස් ආයෝජන සම්බන්ධයෙන් ගත් කැපී පෙනෙන අයුරින් හෝ අනවරත අයුරින් ආයෝජන පිරිවැය එහි සාධාරණ මිලට වඩා අඩුවීමක් පෙන්නුම් කෙරේ නම් එයින් විද්‍යාමාන වන්නේ වත්කම අපවය වී ඇති බවකි. එවැනි කිසියම් සාක්ෂියක් ලැයිස්තුගත කොටස් ආයෝජනයක් සම්බන්ධයෙන් දක්නට ලැබෙන තන්හිදී ඉහතදී ලාභ හෝ අලාභයන්හි දී හඳුනාගන්නා ලද අපවය පාඩුවක් වේනම් එය අඩු කිරීමෙන් අනතුරුව, අත්පත් කර ගැනීමේ පිරිවැය හා වර්තමාන සාධාරණ වටිනාකම අතර වෙනස වශයෙන් මනිනු ලබන සමුච්චිත පාඩුව නැවත වර්ගීකරණය කිරීමේදී සිදු කරනු ලබන සීරුමාරු කිරීමක් ලෙස කොටස් ලාභ හෝ කොටස් අලාභ වශයෙන් නැවත වර්ග කෙරේ. විකිණීමට ඇති කොටස් සාධන පත්‍රයක යොදවා ඇති ආයෝජනයක් සම්බන්ධයෙන් වී ඇති ලාභයක් හෝ අලාභයක් තුල හඳුනාගනු ලබන අපවය පාඩු ලාභ හෝ අලාභ හරහා ප්‍රතිවර්තනය කෙරේ. ප්‍රතිවර්තනය කෙරුණු මුදල සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

ලැයිස්තුගත නොවූ කොටස් ආයේජන සම්බන්ධයෙන් ගත් කල, ආයෝජන පිරිවැයට සාපේක්ෂව ඒවායේ වටිනාකමෙහි කැපී පෙනෙන හෝ අනවරත පහත වැටීමක් සිදුවන්නේ නම් එයින් විද්‍යාමාන වන්නේ වත්කම් අපවය වී ඇති බවකි. ලැයිස්තුගත නොවූ කොටස් ආයෝජන සම්බන්ධයෙන් එවැනි සාක්ෂි ඇත්නම් අපවයවීමේ ප්‍රමාණය මනිනු ලබන්නේ මූල්‍ය වත්කමේ ඉදිරියට ගෙනයන වටිනාකම හා එවැනිම මූල්‍ය වත්කමකින් උද්ගතවන ලාභ, වෙළෙඳපොල අනුපාතික අනුව වට්ටම් කිරීමත් අතර වෙනස මැන බැලීමෙනි. එවැනි අපවය පාඩු ප්‍රතිවර්තනය නොකෙරේ.

## 2.10 වට්ටෝරුගත භාණ්ඩ

පිරිවැයෙහි සහ ශුද්ධ උපලබ්ධි අගයෙහි අඩුම වටිනාකම මත වට්ටෝරුගත භාණ්ඩ ගණනය කෙරේ. පිරිවැය, ‘‘බරතැබූ සාමාන්‍යය‘‘ ක්‍රමය යොදාගනිමින් තීරණය කෙරේ. වට්ටෝරුගත භාණ්ඩ පරිභෝජ්‍ය ද්‍රව්‍ය වලින් සමන්විත වේ.

## 2.11 වෙළඳ ලැබීම් නියමිත

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී සපයන ලද සේවාවන් වෙනුවෙන් ගණුදෙණුකරුවන් වෙතින් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබීම් නියමිත වශයෙන් හඳුන්වනු ලැබේ. ව්‍යාපාර මෙහෙයුම් සාමාන්‍ය කටයුතු චක්‍රය තුල රැස්කිරීම් (වසරක් තුල හෝ අඩු ) අපේක්ෂා කෙරෙන අතර ලැබීම් නියමිත ප්‍රවර්තන වත්කම් ලෙස වර්ග කෙරේ. වෙළඳ ලැබීම් නියමිත ප්‍රාරම්භක වශයෙන් සාධාරණ මිල (ඉන්වොයිස් අගය) අනුව හඳුනා ගැනෙන අතර, ව්‍යාපාර මෙහෙයුම්වල සාමාන්‍ය කටයුතු චක්‍රයතුල ලැබිය යුතු මුදල් අපේක්ෂා කරන හෙයින්, ඉන් ඉක්බිතිව අපමය සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට මුල් ඉන්වොයිස් වටිනාකම අනුව මැන බලනු ලැබේ.

එක් එක් වාර්තා කිරීමේ කාලසීමාව අවසානයේදී වෙළඳ ලැබීම් නියමිත අපමය වී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි ඇත්දැයි සමාගම විසින් සලකා බලනු ඇත. වෙළඳ ලැබීම් නියමිත සම්බන්ධයෙන් අපමය වීම් පිළිබඳව ඇති විෂයානුබද්ධ සාක්ෂිවලට ගෙවීම් රැස්කිරීම හා ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් සමාගමට ඇති අතීත අත්දැකීම් ඇතුලත් වේ. අපමය වීමක් පිළිබඳව විෂයමූලික සාක්ෂි තිබේනම් වෙළඳ ලැබීම් නියමිත අපමයවීම සහ අපමය පාඩු සිදුවේ. වෙළඳ ලැබීම් නියමිත අපමයවීම් වෙනුවෙන් වෙන වෙනම තක්සේරු කෙරේ.

## 2.12 මුදල් හා මුදල් සාමාන්‍යයන්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දැක්වෙන මුදල් හා මුදල් සාමාන්‍යයන්ට අත ඇති මුදල් ඉල්ලුම් තැන්පත් හා කෙටිකාලීන අධි-ද්‍රවශීල ආයෝජන, අත්කර ගැනීමේ දින සිට තෙමසකින් හෝ ඊට අඩු කෙටි කාලයකින් කල් පිරෙන ආයෝජන හා පරිශේෂව පවත්නා බැංකු අයිරා ගෙවූ පසු ඉතිරිවන බැංකු තැන්පතු ඇතුලත් වේ.

## 2.13 ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් කොටස් ස්කන්ධ ලෙස වර්ග කෙරේ.

## 2.14 මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් සෙසු මූල්ය වගකීම්වලට වර්ග කෙරේ. සමාගමේ සෙසු මූල්‍ය වගකීම් යනු වෙළඳ හා අනෙකුත් ගෙවීම් නියමිතයන්ය. අනෙකුත් මූල්‍ය වගකීම් ප්‍රාථමික වශයෙන් සාධාරණ මිල අනුව සහ අදාල වන්නාවූ ගනුදෙනු පිරිවැය වේනම් ඒවා ද ඇතුළුව හඳුනා ගැනේ. ප්‍රාථමික මඳුනා ගැනීමෙන් ඉක්බිතිව මෙකී මූල්‍ය වගකීම් සඵල පොලී අනුපාතිකය යොදා ගනිමින් ක්‍රමකය පිරිවැය අනුව මැන බලනු ලැබේ.

ගිවිසුම්ගත බැඳියාවන් ඉටුකිරීමෙන්, අවලංගු කිරීමෙන් හෝ දින ඉකුත්වීමෙන් සමාගම තම මූල්‍ය වගකීම්වලින් නිදහස් වේ.

## 2.15 වෙළඳ ගෙවීම් නියමිත

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතරතුර සැපයුම්කරුවන් වෙතින් ලබාගන්නා ලද භාණ්ඩ හා සේවාවන් සඳහා බැඳියාවන් වශයෙන් පවතින ගෙවීම් නියමිත ගෙවීම් නියමිත වශයෙන් හඳුන්වනු ලැබේ. ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුලදී, (වසරක් තුල හෝ ඊට අඩු කාලයකදී) ගෙවීමට තිබේ නම් වෙළඳ ගෙවීම් නියමිත ජංගම වගකීම් ලෙස වර්ග කෙරේ. නොඑසේනම් ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ග කරනු ලැබේ. ප්‍රාරම්භක වශයෙන්, වෙළඳ ගෙවීම් නියමිත සාධාරණ මිල අනුව හඳුනාගනු ලබන අතර, ගනුදෙනු මිල අනුව ඉන් ඉක්බිතිව මනිනු ලබන්නේ ඒවා සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් චක්‍රය තුල ගෙවීමට අපේක්ෂා කරනු ලබන හෙයිනි.

## 2.16 රජයේ ප්‍රදාන

ප්‍රදාන ලැබෙන බවට සලකියයුතු සහතිකයක් තිබේනම් සහ සාමාගම විසින් ඊට අදාල කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේ නම් මුදල් නොවන ප්‍රදාන ඇතුළුව රජයේන් ලැබෙන ප්‍රදාන ඒවායේ සාධාරණ මිල අනුව හඳුනාගැනේ.

දේපොල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් රජයෙන් ලැබෙන ප්‍රදාන විලම්බිත ප්‍රදාන ලෙසින් ජංගම නොවන වගකීම් වල ඇතුලත් කෙරෙන අතර, අදාල වත්කම්වල අපේක්ෂිත ආයු කාලය වන සෘජු රේඛා පදනමින්, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

මුදල් නොවන ප්‍රදාන, ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව අගයනු ලබන අතර ඉදිරියට ගෙනයන වටිනාකම අනුව ප්‍රදාන හා වත්කම් ලෙස ගිණුම්ගත කෙරේ.

## 2.17 ණය ගැනුම් පිරිවැය

ණයට ගැනුම් ඒවා සිදිකරන ලද වර්ෂයට අනුව සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනේ.

## 2.18 ප්‍රවර්තන හා විලම්බිත බදු

සමාලෝචිත කාලසීමාව තුල වියදම්වලට ඇතුලත් වන්නේ ප්‍රවර්තන හා විලම්බිත බදුය. වෙනත් සවිස්තරාත්මක ආදායම් තුල හඳුනා ගන්නා ලද භාණ්ඩ විෂයන්ට බදු අදාලවන පමණට සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලැබේ. මෙම කරුණ සම්බන්ධයෙන් ගත්කල, බද්ද ද වෙනත් සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයන් ද හඳුනා ගැනේ. වාර්තා කිරීමේ අවසාන දිනට බලාත්මකව පවතින බදු නීති අනුව ගෙවිය යුතු ප්‍රවර්තන ආදායම් බද්ද ගණනය කරනු ලබන අතර, කළමනාකාරිත්වය විසින් බදු අධිකාරී ආයතනවලට ගෙවිය යුතු යැයි අපේක්ෂා කරන ආදායම් බද්ද යෝග්‍ය පරිදි ගෙවීම සඳහා විධිවිධාන පිළියෙල කරනු ලැබේ.

වත්කම් හා වගකීම්වල බදු මූලයන් අතර හා මූල්‍ය ප්‍රකාශයන්හි ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම් තුලින් උද්ගතවන්නා වූ තාවකාලික වෙනස්කම් මත විලම්බිත බද්ද හඳුනා ගැනේ. ව්‍යාපාරික සංයෝජනයකදී එම ගනුදෙනුව සිදුවන අවස්ථාව වනවිට එහි ගිණුම් හෝ බද්දට යටත් ලාභාය හෝ පාඩුව යන කවර දෙයකට වත් බලපෑමක් නොවන ගනුදෙනුවක් හැර, ගනුදෙනුවක් තුල වත්කමක් හෝ වගකීමක් ප්‍රාරම්භකව හඳුනා ගැනීමෙන් ඉක්බිතිව විලම්බිත බද්දක් පැන නොනැඟේ නම් එය ගිණුම්ගත කරනු නොලැබේ.

වාර්තා කිරීමේ කාලසීමාව අවසන්වන දිනයට බලාත්මකව පවතින බදු අනුපාත යොදා ගනිමින් විලම්බිත බද්ද තීරණය කරනු ලබන අතර, අදාල විලම්බිත බදු වත්කම උපලබ්ධි වීම හෝ විලම්බිත ආදායම් බද්ද නිරවුල් කරන විට අදාල කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තාවකාලික වෙනස්කම් ප්‍රයෝජනයට යොදාගත හැකි පසුබිමක් තුල අනාගත බදු ලාභයක් අත්වෙතැයි උපකල්පනය කළ හැකි සීමාව දක්වා විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ. ප්‍රවර්තන බදු වගකීම් තිබෙන විටදී සහ එකම බදු අධිකාරී ආයතනය විසින් අයකරනු ලබන ආදායම් බද්දට විලම්බිත බදු වත්කම් හා වගකීම් සම්බන්ධතාවයක් ඇති විටදී ප්‍රවර්තන බදු වත්කම් හිලව් කිරීම නීතිමය වශයෙන් බලාත්මක කිරීමට අයිතිවාසිකම ඉඩ ඇති තන්හිදී විලම්බිත බදු වත්කම් හා වගකීම් හිලව් කරනු ලැබේ.

## 2.19 (අ) සේවක ප්‍රතිලාභ

නිශ්චිත ප්‍රතිලාභ සහ නිශ්චිත දායකත්ව යනුවෙන් සමාගමට නිශ්චිත සැලසුම් දෙකක් තිබේ.

### (ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා නියුක්ති සැලැස්මක් වන අතර ඒ යටතේ සමාගම විසින් වෙනමම ආයතනයක් වෙත ස්ථිර දායකත්ව මුදලක් ගෙවනු ලබයි. ඉන් ඔබ්බට දායකත්ව මුදල් ගෙවීම සඳහා සමාගමට නෛතික හෝ සාධනීය (Constructive) බැඳියාවන් නැත. ගෙවීමට නියමිත අවස්ථාවන්හිදී දායකත්ව මුදල් සේවක ප්‍රතිලාභ වියදම් යනුවෙන් හඳුනාගනු ලැබේ. සේවකයින්ගේ දල වැටුපෙන් 15% ක් සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවන අතර, සේවකයින්ගේ දල වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට (ETF) දායකත්වය සපයයි.

### (ඇ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් සමාගමේ බැඳියාව වන්නේ වර්තා කිරීමේ අවසන් දිනට නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවන්හි ප්‍රවර්තන වටිනාකමයි. වාර්ෂිකව නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව නිශ්චය කරනු ලබන්නේ ප්‍රක්ෂිප්ත ඒකක බැර ක්‍රමය අනුව ගණනය කරනු ලබන පාරිතෝෂික සූත්‍රය පදනම් කර ගෙනය.

නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවේ වර්තමාන අගය තීරණය කරනු ලබන්නේ ප්‍රවර්තන හා ඉහත කාලපරිච්ඡේද තුල ඉටුකරන ලද සේවාවන් වෙනුවෙන් සේවකයින් උපයන ලද ඇස්තමේන්තු කල අනාගත ප්‍රතිලාභ වට්ටම් කිරීමෙනි.

උපකල්පන වෙනස්වීමෙන් ජනිත වන්නා වූ ලාභ සහ පාඩු, වර්තමාන සේවා පිරිවැය හා පොලිය ඒවා උද්ගතවන කාලයට අදාල සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුල හඳුනා ගැනේ.

විශ්‍රාම ප්‍රතිලාභ බැඳියාවන් වෙනුවෙන් බාහිරව මූල්‍ය සම්පාදනයක් නොකෙරේ.

### (ඈ) කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

ආශ්‍රිත සේවාවන් සඳහා සේවකයින්ට ගෙවනු ලැබීමට අපේක්ෂා කරන වට්ටම් නොකළ මුදල මත කෙටිකාලීන සේවක ප්‍රතිලාභ ගණනය කරනු ලැබේ.

## 2.20 ප්‍රතිපාදන හා සම්භාව්‍ය බැරකම්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් වර්තමානයේදී නීතිමය හෝ සම්ප්‍රයුක්ත බැඳියාවක් තිබෙන විටදී නෛතික හිමිකම් ඉල්ලීම් සහ වෙනත් මෙහෙයුම් වියදම් හඳුනා ගැනේ. මේ අනුව සමාගමේ ආර්ථික සම්පත් බාහිර ගලනයක් සිදුවීමේ සම්භාවිතාවක් තිබිය හැකි අතර, මුදල් ප්‍රමාණයන් විශ්වාසදායක අයුරින් ඇස්තමේන්තු කල හැකිවේ. වත්මන් බැඳියාවන්ට අදාලව පවතින අවදානම් සහම අවිනිශ්චිතතාවන් ඇතුළු, වාර්තා කරන දිනය වන විට ලබාගත හැකි ඉතා විශ්වාසදායක සාක්ෂි පදනම් කරගෙන වත්මන් බැඳියාවන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු කල වියදම අනුව ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ.

සම්පත් ගලනයවීමේ සම්භාවිතාවන් ඉතා දුරස්ව නොමැති කල්හි සියළු සම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශයන් සඳහා වූ සටහනක් ලෙසින් හෙළිදරව් කෙරේ.

## 2.21 ආදායම හඳුනාගැනීම

ආදායම හඳුනා ගැනෙනුයේ සමාගම වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා එනු ඇතැයි සහ ආදායම් හා දරණු ලබන හෝ දැරිය යුතු එකතුකල අගය මත බද්ද හා ජාතිය ගොඩගැනීමේ බද්ද හැර, ඒ ආශ්‍රිත වියදම විශ්වාසදායක ලෙස ගණනය කළ හැකිවේදැයි අනුමාන කරනු ලබනතාක් දුරටය. ආදායම ගණනය කෙරෙනුයේ වෙළඳ වට්ටම් හා විකුණුම් බදු රහිතව ලබාගත් හෝ ලැබිය හැකි වූ ප්‍රතිලාභයේ සාධාරණ අගය අනුවය.

ආදායම හඳුනාගැනීමේ කාර්යාර්ථය සඳහා පහත සඳහන් නිර්ණායක භාවිතා කෙරේ.

**(අ) යාත්‍රා ආදායම**

නැව්බඩු මෙහෙයුම් කටයුතු හා ප්‍රවාහන සේවාවලින් ජනිතවන ආදායම සේවාවන් සම්පූර්ණ කිරීම පදනම් කරගෙන සේවාවන් ඉටුකල වර්ෂයතුලදී හඳුනාගනු ලබන අතර, සපයන ලද සත්‍ය සේවාවන් අනුව තක්සේරු කරනු ලැබේ.

**(ආ) නැව්කුලී ආදායම**

නැව්කුලියට දීමෙන් ලැබෙන ආදායම, කුලියට දීමේ ගිවිසුමේ කාලපරිච්ඡේදය අනුව උපචිත පදනමක් මත හඳුනාගනු ලැබේ.

**(ඇ) නියෝජ්‍යායතන ගාස්තු**

ඉටුකරන ලද සේවාවන් පදනම් කරගෙන එකී සේවාවන් ඉටුකල කාලය වෙනුවෙන් ලැබූ ලාභය වශයෙන් නියෝජ්‍යායතන ගාස්තු හඳුනා ගනු ලැබේ.

**(ඈ) පොලී ආදායම**

සඵල පොලී අනුපාතිකය යොදා ගනිමින් ආදායම හඳුනාගනු ලැබේ.

**(ඉ)** දේපල, පිරියත, උපකරණ විකිණීමෙන් ලැබූ ලාභය හා පාඩු ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම සමග ඒවා විකිණීමෙන් ලත් මුදල් සැසඳීම මගින් තීරණය කරනු ලබන අතර සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය හඳුනා ගැනේ.

**(ඊ)** ලාභාංශ ආදායම

ගෙවීම් ලැබීම් සඳහා වූ අයිතිය තහවුරු වූ පසු ලාභාංශ ආදායම හඳුනාගනු ලැබේ.

## 2.22 වියදම්

මෙහෙයුම් කටයුතු සඳහා වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුල දරණ වියදම් මෙම ගණයට අයත්වේ.

**2.23** **වාර්තා කිරීමේ කාලසීමාවෙන් පසුව උද්ගත වූ සිද්ධීන්**

වාර්තා කිරීමේ කාලසීමාවෙන් පසුව සිදුවූ සිද්ධීන් සලකා බලන ලද අතර, යෝග්‍ය තන්හිදී සීරුමාරු කිරීම් හෝ හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශයන් සඳහා වූ එක් එක් සටහන් තුලින් සිදුකරනු ලැබ ඇත.

**2.24** වාර්තා කිරීමේ දිනය අවසන් වනවිට තිබූ සියළු භෞතිකමය බැඳියාවන් මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් මගින් හඳුනාගෙන හෙළිදරව් කරනු ලැබ ඇත.

**3.** **දැනට නිකුත්කොට ඇති නමුත් තවමත් ක්‍රියාත්මක නැති ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්**

මූල්‍ය ප්‍රකාශ නිකුතු දිනය වන විට නිකුත්කොට ඇත. එහෙත් ක්‍රියාත්මකව නැති ගිනුම්කරණ ප්‍රමිතීන් පහත දක්වා ඇත. ඒවා සක්‍රීය වනවිට භාවිතයට ගැනීමට සමාගම අදහස් කරයි.

**(අ)** SLFRS a - මූල්‍ය සාධනපත්‍ර: නිකුත් කරන ලද SLFRS මගින් පිළිබිඹු කෙරෙන්නේ LKAS 39 ප්‍රතිස්ථාපනය කිරීම වන අතර, එය LKAS 39 මගින් නිශ්චිතව දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් හඳුනා ගැනීම, වර්ගකිරීම හා ගණනය කිරීමට අදාල වේ. මෙම ප්‍රමිතිය 2015 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන වාර්ෂික කාල පරිච්ඡේදයන් හෝ ඉන්පසු කාල පරිච්ඡේදය සඳහා මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක වේ.

**(ආ)** SLFRS 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ: SLFRS 10 මගින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල ගිණුම් තැබීම් ආමන්ත්‍රණය කෙරෙන LKA 27 ඒකාබද්ධ හා කේවල මූල්‍ය ප්‍රකාශයන්හි කොටසක් ප්‍රතිස්ථාපනය කරයි. SLFRS a SLFRS මගින් නියම කෙරෙන දෙයක් නම් කුමන ආයතන පාලනය කරනු ලබන්නේ ද යන්න සම්බන්ධයෙන් කැපීපෙනෙන තීන්දු කළමනාකාරිත්වයට නියම කරනු ලැබීම වන අතර එබැවින් ඒවා LKAS 27 දැක්වෙන නියමතාවන්ට සරිලන අයුරු මව් සමාගමක් විසින් ඒකාබද්ධ කිරීම අවශ්‍ය කෙරේ. මෙම ප්‍රමිතිය 2014 ජනවාරි 01 දිනෙන් ආරම්භවන ඉන්පසුව ආරම්භවන වාර්ෂික කාලසීමාවන් සඳහා මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක වේ.

**(ඇ)** SLFRS 12 -වෙනත් ආයතනවල ඇති සම්බන්ධතා

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන් මුලින් LKAS 27 මගින් කරන ලද හෙළිදරව් කිරීම් මෙන්ම LKAS 31 සහ LKAS 28 මගින් පෙරාතුව සිදු කරන ලද සියළු හෙළිදරව් කිරීම් SLFRS 12 ට ඇතුලත් වේ. මෙම හෙළිදරව් කිරීම් වූ කලී උපකාරක සමාගම්, ඒකාබද්ධ විධිවිධාන හා ආශ්‍රිත ආයතන සමඟ සමාගමේ ඇති සම්බන්ධතාවයට අදාල ඒවාය. මෙම ප්‍රමිතිය 2014 ජනවාරි 01 දින සිට ආරම්භවීම හෝ එම දිනයෙන් පසුව එළැඹෙන වාර්ෂික කාලපරිච්ඡේද සම්බන්ධයෙන් ක්‍රියාත්මක වේ.

**(ඈ)** SLFRS 13 - සාධාරණ මිල ගණනය කිරීම -SLFRS 13 මගින් සාධාරණ මිල ගණනය හා හෙළිදරව් කිරීම් සමබන්ධයෙන් මාර්ගෝපදේශ දක්වයි. මෙම ප්‍රමිතිය මගින් මූල්‍ය තත්ත්වය හා කාර්ය සාධනය මත මෙම ප්‍රමිතිය තුලින් වන බලපෑම සමාගම විසින් දැනට තක්සේරු කරගෙන යනු ලබයි. මෙය 2014 ජනවාරි 01 දින ආරම්භවන හෝ ඉන් පසුව කාලපරිච්ඡේද සඳහා ක්‍රියාත්මක වේ.

## 4. කැපී පෙනෙන ගිණුම් ඇස්තමේන්තු හා තීරණ

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, වත්කම් , වත්කම් ආදායම හා වියදම හඳුනාගෙන ඒවා ගණනය කිරීම සම්බන්ධයෙන් කළමනාකාරිත්වය විසින් තීරණ ඇස්තමේන්තු හා උපකල්පන රාශියක් සිදුකරනු ලබයි.

**i.** මූල්‍ය ප්‍රකාශ කෙරෙහි ඉතාමත් කැපී පෙනෙන බලපෑමක් සිදුකෙරෙන ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කිරීම හරහා පහත සඳහන් තීන්දුවලට එළැඹීම සිදුවිය.

(අ) **විලම්බිත බදු වත්කම් හඳුනා ගැනීම**

විලම්බිත බදු වත්කම් කොතරම් දුරට හඳුනාගත හැක්කේ ද යන්නට පදනම් කරගනු ලබන්නේ විලම්බිත බදු වත්කම් පාවිච්චියට ගැනීමේ හැකියාව අනුව බද්දට යටත් අනාගත ආදායම තක්සේරු කිරීමේ සම්භාවිතාවයි.

**ii.** වත්කම්, වගකීම් හා ආදායම හා වියදම හඳුනා ගැනීම හා ගණනය කිරීම කෙරෙහි වඩාත් කැපී පෙනෙන බලපෑමක් සිදුකරන ඇස්තමේන්තු හා උපකල්පන පහත දැක්වේ.

**(අ) ක්ෂයකල හැකි වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයු කාලය.**

වත්කමේ අපේක්ෂිත ආර්ථික ප්‍රයෝජ්‍යතාව පදනම් කරගෙන එක් එක් වාර්තා කිරීමේ දිනට, ක්ෂය කල හැකි වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයුකාලය පිළිබඳ ඇස්තමේන්තු කළමනාකාරිත්වය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම ඇස්තමේන්තුවල දැක්වෙන අවිනිශ්චිතතාවන් නම්, ඇතැම් මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ උපකරණවල ප්‍රයෝජ්‍යතාව වෙනස්වන තාක්ෂණික වශයෙන් යල්පැනීම් සම්බන්ධ ඒවාය.

**(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම**

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මේ බැඳියාවන්හි වත්මන් අගය රඳා පවතින්නේ උපකල්පන ගණනාවක් භාවිතා කොට ප්‍රක්ෂේපනය කරන ලද ඒකක බැර පදනම මත තීරණය කරනු ලබන සාධක ගණනාවක් මතය. වට්ටම් අනුප්‍රමාණය ඇතුළුව නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම වෙනුවෙන් ශුද්ධ පිරිවැය හා බැඳියාවන් නිශ්චය කිරීම පිළිබඳ කරුණු 29 වැනි සටහනින් එළිදරව් කොට තිබේ. මෙකී උපකල්පනයන්හි සිදුවන වෙනස්කම් නිශ්චිත ප්‍රතිලාභ බැඳියාවන්හි ඉදිරියට ගෙනයන වටිනාකමට බැලපෑම් සිදු කරයි.

## 5. SLFRS/LKRS ප්‍රමිතීන් ප්‍රථම වතාවට යොදා ගැනීම

2013 මාර්තු 31 දිනෙන් අවසන් වූ වාර්තා කිරීමේ කාලය සඳහා වූ මූල්‍ය වාර්තා වූ කලී ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLFRS) අනුව පිළියෙල කරන ලද පළමු මූල්‍ය ප්‍රකාශයන්ය. 2012 මාර්තු 31 දිනෙන් අවසන් වූ වාර්තා කිරීමේ කාලසීමාව ඇතුළු මීට ඉහත වාර්තා කිරීමේ කාලසීමාවන් තුල සමාගම විසින් තම මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලැබුයේ 2011 දෙසැම්බර් 31 දින දක්වා ක්‍රියාත්මකව පැවති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් (SLAS) ප්‍රකාරවය.

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් වන ප්‍රාරම්භක ප්‍රකාශයේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLAS) පරිවර්තන දිනය 2011 අප්‍රේල් 1 දින වශයෙන් සඳහන් කරන ලදී. මෙම සටහන මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLAS) ප්‍රකාරව පිළියෙල කෙරුණු මූල්‍ය ප්‍රකාශ, SLFRS ප්‍රමිතීන් දක්වා පරිවර්තනය වීමේදී 2011 අප්‍රේල් 01 දින සිට 2012 මාර්තු 31 දක්වා කාලසීමාවන් සම්බන්ධයෙන් සිදු කෙරුණු ප්‍රධාන සීරුමාරු කිරීම් විදහා දැක්වේ.

අතීත සවලතාමය භාවිතයන් වෙතින් විකල්පමය නිදහස්වීම්.
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) ප්‍රකාරව පළමු වතාවට මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සෙසු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්(SLFRS) අතීතයට බලපාන පරිදි යොදා ගැනීමෙන් නිදහස් ව පහත දැක්වෙන විකල්පමය මාර්ගයන්ට අවතීර්ණ වී ඇත.

**(අ)** LKAS - වෙනත් උපකාරක සමාගම් හි ආයෝජන 2011 අප්‍රේල් 01 දින වනවිට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ඉදිරියට ගෙනයන පිරිවැය අනුව, සමාගම විසින් උපකාරක සමාගම්වල කරන ලද ආයෝජන ගණනය කරනු ලැබ ඇත.

**(ආ)** සාධාරණ මිල හෝ ප්‍රත්‍යාගණනය උද්දේශික පිරිවැය ලෙස 2012 මාර්තු 31 දිනට පෙරාතුව පැවැති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ප්‍රකාරව, පිළියෙල කරන ලද මූල්‍ය තත්ත්වයන් ප්‍රකාශය තුල දේපොල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ වටිනාකම අනුව ඉදිරියට ගෙන යන ලදී. සමාගම විසින් මෙම ප්‍රත්‍යාගණනය කළ වටිනාකම්, එකී ප්‍රත්‍යාගණන දිනය වනවිට උද්දේශික පිරිවැය වශයෙන් සළකනු ලැබ ඇත්තේ ප්‍රත්‍යාගණන දිනයට, ඒවා පුළුල් ලෙස සාධාරණ මිල හා ප්‍රත්‍යාගණන දිනයට ඒවා පුළුල් ලෙස සාධාරණ මිල හා සන්සන්දනාත්මක වන බැවිනි.

**(ඇ)** කලින් හඳුනාගත් මූල්‍ය උපකරණ නම් කිරීම
දිගු කාලීන ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ කොටස් සාධනපත්‍ර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට මාරුවූ දිනට පැවති විකිණීමට ඇති ආයෝජන ලෙස සමාගම විසින් නම් කොට ඇත.

**(ii)** පහත දැක්වෙන විකල්පමය නිදහස් කිරීම් සමාගමට අදාල නොවේ.

**(අ)** SLFRS 4 - රක්ෂණ කොන්ත්‍රාත්තු - මෙය යොදා ගැනීම සමාගමට අදාල නොවේ.

**(ආ)** IFRIC 4 - කල්බදු සම්බන්ධ කටයුතු සමාගමට නොමැති හෙයින් කල්බදු ඇතුලත්වේද යන්න තීරණය කිරීම සඳහා

**(ඇ)** LKAS 19 - සේවක ප්‍රතිලාභ - සූත්‍රයක් උපයෝගී කරගනිමින් සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ බැදියාවන් ගණනය කරනු ලබන හෙයින්

**(ඇ)** LKAS 21 - සමුච්චිත පරිවර්ත්‍ය වෙනස්කම් - සමාගම විදේශීය මෙහෙයුම්වල නිරත නොවන බැවින්

**(ඉ)** උපකාරක සමාගම්, ආශ්‍රිතයින් හා ඒකාබද්ධ ආදායම් ප්‍රාග්ධන සමාගම් - සමාගම සමඟ උපකාරක සමාගම් හා ආශ්‍රිතයින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAS) වෙතින් SLFRS වෙතට එකවරම මැරුවීම.

**(ඊ)** LKAS 32 - සංයුක්ත මූල්‍ය සාධනපත්‍ර - සමාගමට සංයුක්ත මූල්‍ය සාධන පත්‍ර නොමැති හෙයින්.

**(උ)** දේපොල, පිරියත හා පිරිවැයට ඇතුලත් බැඳියාවන් නතර කිරීම - දේපොල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් අත්හැරීමේ වගකීමක් සමාගමට නොමැති හෙයින්.

**(ඌ)** IFRIC 12 - සේවා සහන විධිවිධාන - සමාගමට එවැනි විධිවිධාන නොමැති හෙයින්.

අතීතයට බලපාන පරිදි අදාල කරගැනීමෙන් බැහැර කෙරෙන අනිවාර්ය ව්‍යාතිරේක:
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව පළමුවරට මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වෙනත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් අතීතයට බලපාන පරිදි අදාල කර ගැනීමේ දී, පහත දැක්වෙන අනිවාර්ය ව්‍යාතිරේක යොදා ගැනීමට සමාගම නැඹුරු විය.

**1. ගිණුම් ඇස්තමේන්තු**

පහත දැක්වෙන දෑ හැරුණුකොට,SLFRS ප්‍රමිතීන්ට පරිවර්තනය වූ දිනට සහ 2012 මාර්තු 31 දිනට, සියලු ගිණුම් ඇස්තමේන්තු ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුව පිළියෙල කරන ලද ඇස්තමේන්තුවලට අනුකූලව SLFRS ප්‍රමිතීන්ට මාරු වූ දිනය හා 2012 මාර්තු 31 දිනට සියළු ගිණුම් ඇස්තමේන්තු අනුකූලය.

**(අ)** දේපොල, පිරියත, උපකරණ හා ස්පර්ශනීය නොවන වත්කම්වල ප්‍රයෝජ්‍ය ආයුකාලය SLFRS ප්‍රමිතීන්ට අනුකූලව නැවත ඇස්තමේන්තු කරන ලද්දේ ශ්‍රී ලංකා මූල්‍ය රෙගුලාසි හා ප්‍රමිතීන් (SLFRS) ට මාරු වූ දිනය වන විට හා 2012 මාර්තු 31 දිනට නැවත මූල්‍ය තත්ත්වයන් පිළිබිඹු කිරීම සඳහාය.

**5.1 SLFRS ප්‍රමිතීන්ට මාරුවීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්**

සටහන 2 හි දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති, 2013 මාර්තු 31 දිනෙන් අවසන් වූ වාර්තා කිරීමේ කාලසීමාව සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අදාල කර ගන්නා ලද අතර ඊට 2012 මාර්තු 31 දිනෙන් අවසන් වූ වාර්තා කිරීමේ කාලය සඳහා වූ සංසන්දනාත්මක තොරතුරු සහ සමාගම SLFRS ප්‍රමිතීන්ට මාරුවූ දිනය වන 2011 අප්‍රේල් 01 දිනට SLFRS ආරම්භක ප්‍රකාශයද ඇතුලත්ය.

ඉකුත් වාර්තා කිරීමේ කාල පරිච්ඡේදවල SLFRS ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අනුව (SLFRS) අවැසි සීරුමාරු කිරීම් සිදු කරන ලද SLAS ප්‍රමිතීන් වෙනුවට SLFRS ප්‍රමිතීන්ට මාරුවීමේ දී ඇති වූ බලපෑම, කොටස් සැසඳුම් ප්‍රකාශය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශය සහ සැසඳුම් සඳහා වූ සටහන්වලින් ඉදිරිපත් කරනු ලැබ ඇත.

**මාර්තු 31 දිනයෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **6.** | ආදායම | | |
| | යාත්‍රා ආදායම | 527,424,949 | 221,949,668 |
| | කුලී (Charter) ආදායම | 47,801,910 | 40,988,934 |
| | නැව්බඩු යැවීම් හා නිශ්කාෂණ ආදායම | 30,986,034 | 27,824,623 |
| | නියෝජිත ගාස්තු සහ කොමිස් | 141,557,778 | 48,327,986 |
| | වෙනත් සේවා | 102,962,015 | - |
| | | 850,732,686 | 339,091,211 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **7.** | වෙනත් ආදායම් | | |
| | ලාභාංශ | 337,959 | 718,907 |
| | දේපොල,පිරියත හා උපකරණ විකිණීමෙන් ලාභ | 710,043 | 262,750 |
| | ශුද්ධ විනිමය ලැබීම් | 45,252,357 | 19,218,182 |
| | වෙනත් | 1,917,848 | 7,740,478 |
| | | 48,218,207 | 27,940,317 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **8.** | **ශුද්ධ මූල්‍ය ආදායම** | | |
| | පොලී ආදායම | | |
| | ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වලින් පොලිය | 38,448,458 | 23,172,691 |
| | සේවක මණ්ඩල ණය පොලිය | 999,378 | 782,130 |
| | | 39,447,836 | 23,954,821 |
| | පොලී වියදම් | | |
| | බැංකු අයිරා පොලිය | (42,574) | (2,392,222) |
| | | (42,574) | (2,392,222) |
| | | 39,405,262 | 21,562,599 |

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **9.** | බද්දට පෙර ලාභය: ගණනය කරන ලද්දේ පහත දැක්වෙන විෂයයන් ඇතුළු සියළු වියදම් අයපත් කිරීමෙනි. | | |
| | අධ්‍යක්ෂකවරුන්ගේ පඩිනඩි | 1,974,194 | 958,500 |
| | විගණකවරුන්ගේ පඩිනඩි | 859,000 | 795,500 |
| | ක්ෂයවීම් | 4,166,202 | 3,767,523 |
| | නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය EPF/ETF | 8,605,968 | 9,488,778 |
| | නිශ්චිත දායකත්ව සැලසුම් පිරිවැය විශ්‍රාම පාරිතෝෂික | 805,230 | 931,858 |
| | කාර්ය මණ්ඩල සඳහා පිරිවැය | 78,434,192 | 77,836,176 |
| | වෘත්තීමය හා නෛතික ගාස්තු | 7,132,001 | 277,492 |
| | කාර්යයන්හි ප්‍රගතිය අපචයවීම් සඳහා ප්‍රතිපාදන | 3,626,440 | - |

## 10. ආදායම් බදු වියදම්

| | 2013 | 2012 |
|---|---|---|
| ප්‍රවර්තන බදු වියදම් (සටහන 10.1) | 41,223,690 | 7,878,198 |
| විලම්බිත බදු අයකිරීම් (ප්‍රතිවර්තන) (සටහන 18) | 14,695,235 | 1,614,780 |
| | 55,918,925 | 9,492,978 |
| | ======== | ======= |

### 10.1 බද්දට යටත් ලාභය හා ගිණුම්කරණ ලාභය සැසඳීම

| | 2013 | 2012 |
|---|---|---|
| බදුකරණයට පෙර ගිණුම්කරණ ලාභය | 274,710,969 | 93,701,526 |
| අඩුකලා: ආශ්‍රිත සමාගම්වල ලාභයේ කොටස (බදු හැර) | (21,387,767) | (18,954,260) |
| | 253,323,202 | 74,747,266 |
| ඉඩදිය නොහැකි විෂයාංග මුළු එකතුව | 10,475,586 | 36,758,807 |
| ඉඩදිය හැකි විෂයාංග මුළු එකතුව | (12,998,153) | (6,841,435) |
| | (84,753,481) | (84,801,305) |
| | 166,047,154 | 19,863,333 |
| බද්දට යටත් නැති (ආදායම)/පාඩුව වෙළදාම හෝ ව්‍යාපාරයෙන් ලාභය | | |
| බද්දට යටත් වෙනත් ආදායම් - | | |
| පොලී ආදායම | 36,113,782 | 23.423,469 |
| මුළු ව්‍යවස්ථාපිත ආදායම | 202,160,936 | 43,286,802 |
| භාවිත බදු පාඩු: | ( 54,933,473) | (15,150,381) |
| තක්සේරු කළ හැකි /බද්දට යටත් ආදායම | 147,227,463 | 28,136,421 |
| 28% ව්‍යවස්ථාපිත අනුප්‍රමාණය අනුව අයකළ බද්ද | 41,223,690 | 7,878,198 |
| **වර්ෂය සඳහා සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙනුවෙන් වූ ප්‍රවර්තන බදු** | **41,223,690** | **7,878,198** |
| | ======== | ======= |

## 11. කොටසක් වෙනුවෙන් මූලික ඉපැයීම්

කොටසක් වෙනුවෙන් වූ මූලික ඉපැයීම් ආගණනය කෙරෙනුයේ වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුල නිකුත් කොට ඇති සාමාන්‍ය කොටස්වල බරතැබූ මධ්‍ය සංඛ්‍යාවෙන් සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය කළ හැකි වන්නා වූ ශුද්ධ ලාභය බෙදීමෙනි.

| | | |
|---|---|---|
| ලවය වශයෙන් භාවිතා කරන ලද මුදල- කොටස් හිමි ආරෝපිත ශුද්ධ ලාභය | 218,792,044 | 84,208,548 |
| හරය වශයෙන්භාවිතා කරන ලද සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 5,000,000 | 5,000,000 |
| කොටසක් වෙනුවෙන් වූ මූලික ඉපැයීම් (රු.) | 43.76 | 16.84 |
| | ===== | ===== |

## මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2013 මාර්තු 31 දිනට

**12. දේපල, පිරියත හා උපකරණ**

| තනි අයිතිය පිරිවැය හෝ තක්සේරුව | ඉඩම් හා නිවාස ව්‍යාපෘති | ගොඩනැගිලි | නෞකා | බහාළුම් | මෝටර් වාහන | ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | කාර්යාලීය උපකරණ හා පරිගණක | ස්ප්‍රෙඩර් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2011 අප්‍රේල් 1 දිනට ශේෂය | 5,286,340 | 43,390 | 330,000,000 | 7,048,348 | 31,541,932 | 10,470,421 | 10,852,753 | 1,828,962 | 397,072,146 |
| සීරුමාරු කිරීම් | - | - | (70,000,000) | (7,048,348) | - | - | - | - | (77,048,348) |
| එකතු කිරීම් | - | - | - | - | - | 20,096,315 | 2,799,800 | - | 22,896,115 |
| බැහැර කිරීම් | - | - | - | - | (260,000) | (471,575) | (289,808) | - | (1,021,383) |
| 2012 මාර්තු 31ට ශේෂය | 5,286,340 | 43,390 | 260,000,000 | - | 31,281,932 | 30,095,161 | 13,362,745 | 1,828,962 | 341,898,530 |
| එකතු කිරීම් | - | - | - | - | - | 1,343,793 | 1,301,331 | - | 2,645,124 |
| බැහැර කිරීම් | - | - | - | - | (735,000) | (520,564) | (15,600) | - | (1,271,164) |
| 2013 මාර්තු 31 ට ශේෂය | 5,286,340 | 43,390 | 260,000,000 | - | 30,546,932 | 30,918,390 | 14,648,476 | 1,828,962 | 343,272,490 |
| ක්ෂයවීම් | | | | | | | | | |
| 2011 අප්‍රේල් 1 දිනට ශේෂය | 1,112,901 | 43,390 | 282,866,788 | 7,048,348 | 29,216,928 | 8,509,653 | 9,775,066 | 1,828,962 | 340,402,036 |
| වසර සඳහා අයකිරීම් | 64,320 | - | - | - | 774,996 | 1,935,789 | 992,418 | - | 3,767,523 |
| සීරුමාරු කිරීම් | - | - | (57,673,200) | (7,048,348) | - | - | - | - | (64,721,548) |
| බැහැර කිරීම් | - | - | - | - | (260,000) | (471,575) | (289,808) | - | (1,021,383) |
| 2012 මාර්තු 31 ශේෂය | 1,177,221 | 43,390 | 225,193,588 | - | 29,731,924 | 9,973,867 | 10,477,676 | 1,828,962 | 278,426,628 |
| වසර සඳහා අයකිරීම් | 17,623 | - | - | - | 774,996 | 2,408,052 | 965,531 | - | 4,166,202 |
| සීරුමාරුකිරීම් | - | - | - | - | (10,905,477) | (28,612) | - | - | (10,934,089) |
| බැහැර කිරීම් | - | - | - | - | (735,000) | (494,366) | (15,600) | - | (1,244,966) |
| 2013 මාර්තු 31 ට ශේෂය | 1,194,844 | 43,390 | 225,193,588 | - | 18,866,443 | 11,858,941 | 11,427,607 | 1,828,962 | 270,413,775 |

| ඉදිරියට ගෙනයන ශුද්ධ වටිනාකම් | **2013** | **2012** | **2011 අප්‍රේල් 01 දිනට** |
|---|---|---|---|
| ඉඩම් හා නිවාස ව්‍යාපෘතීන් | 4,091,496 | 4,109,119 | 4,173,439 |
| ගොඩනැගිලි - - - | | | |
| යාත්‍රා | 34,806,412 | 34,806,412 | 47,133,212 |
| බහාලුම් - - - | | | |
| මෝටර් වාහන | 11,680,489 | 1,550,008 | 2,325,004 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 19,059,449 | 20,121,294 | 1,960,768 |
| කාර්යාලීය උපකරණ හා පරිගණක | 3,220,869 | 2,885,069 | 1,077,687 |
| ස්ප්‍රෙඩර් යන්ත්‍ර | - | - | - |
| | **72,858,715** | **63,471,902** | **56,670,110** |
| කෙරීගෙන යන වැඩ (12.1 සටහන) | 3,626,440 | 3,626,440 | 94,616 |
| | (3,626,440) | - | - |
| අපවයවීම් සඳහා ප්‍රතිපාදන | **72,858,715** | **67,098,342** | **56,764,726** |

(වරහන්තුල ඇති සංඛ්‍යාවන්ගෙන් අඩුකිරීම් දැක්වේ)

| | | 2013 | 2012 | 2011 අප්‍රේල් 01 දිනට |
|---|---|---|---|---|
| **12.1** | කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු (ගොඩනැගිලි) | | | |
| | අප්‍රේල් 01 දිනට ශේෂය | 3,626,440 | 94,616 - | |
| | එකතු කිරීම් - | | 3,531,824 | 94,616 |
| | මාරු කලා - - - | | | |
| | මාර්තු 31 දිනට ශේෂය | **3,626,440** | **3,626,440** | **94,616** |

| | | | | |
|---|---|---|---|---|
| **12.2** | මුළු වත්කම්වල (ඉදිරියට ගෙනයන) වටිනාකම | | | |
| | පිරිවැය අනුව | 34,052,304 | 24,665,490 | 5,536,898 |
| | තක්සේරුව අනුව | 38,806,412 | 38,806,412 | 51,133,212 |
| | | **72,858,716** | **63,471,902** | **56,670,110** |

දේපොල, පිරියත හා උපකරණ 1994 ජුලි රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නැවතත් තක්සේරු කරන ලදී. දේපොල, පිරියත හා උපකරණ අදාල සීරුමාරු කිරීම් සහිතව ඒවායේ භාවිත තත්ත්වයන් අනුව විවෘත වෙළඳපොල වටිනාකම් පදනම් කරගෙන තක්සේරු කෙරිණි.

**12.3** මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කිරීමට තිබූ, ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ඉදිරියට ගෙනඑන වටිනාකම්වල (ක්ෂයවීම් අඩුකොට) ඉදිරියට ගෙනයන වටිනාකම් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| පිරිවැය | 406,819,749 | 406,819,749 | 406,819,749 |
| සමුච්චිත ක්ෂයවීම් | (368,013,337) | (368,013,337) | (368,013,337) |
| ඉදිරියට ගෙනයන වටිනාකම | **38,806,412** | **38,806,412** | **38,806,412** |

පිරිවැය රු. 27,009,274 (2012-රු. 52,232,552) සහිත සමාගමේ දේපොල, පිරියත හා උපකරණ මුළුමණින්ම ක්ෂයගත කරන ලද අතර සමාගම විසින් නොකඩවා භාවිතයට ගන්නා ලදී.

| | | | | |
|---|---|---|---|---|
| **13.** | **ස්පර්ශනීය නොවන වත්කම්** | | | |
| | පරිගණක මෘදුකාංග | | | |
| | පිරිවැය | | | |
| | වර්ෂය ආරම්භ වන විට ශේෂය | 6,144,497 | 6,144,497 | 6,144,497 |
| | එකතු කිරීම් | - | - | - |
| | වර්ෂය ආරම්භ වනවිට ශේෂය | **6,144,497** | **6,144,497** | **6,144,497** |
| | **ක්‍රමක්ෂය** | | | |
| | වර්ෂය ආරම්භ වනවිට ශේෂය | 6,144,497 | 6,144,497 | 6,144,497 |
| | වර්ෂය සඳහා අය කිරීම් | - | - | - |
| | වර්ෂය ආරම්භ වනවිට ශේෂය | **6,144,497** | **6,144,497** | **6,144,497** |
| | ඉදිරියට ගෙනයන මුළු වටිනාකම | - | - | - |

**14.** උපකාරක සමාගම්වල ආයෝජන

| | කොටස් සංඛ්‍යාව | හිමි ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|
| සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් | 9999 | 100% | 99,990 | 99,990 | 99,990 |
| අපවය සඳහා ප්‍රතිපාදන | | | (99,990) | (99,990) | (99,990) |
| | | | - | - | - |

උපකාරක සමාගම් වසා දැමීම සඳහා 2006 මාර්තු 20 වැනි දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණයේ ප්‍රතිඵලයක් වශයෙන් උපකාරක සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමාගම විසින් ඒකාබද්ධව නොකොට තිබේ. අධ්‍යක්ෂක මණ්ඩල තීරණයෙන් ඉක්බිතිව 2006 මැයි සිට උපකාරක සමාගම තම මෙහෙයුම් නවතා තිබේ. දැනට උපකාරක සමාගම ඇවර කෙරෙමින් පවතී.

**15.** ආශ්‍රිත සමාගම්වල ආයෝජන

| | කොටස් සංඛ්‍යාව | **හිමි ප්‍රතිශතය** | **මාර්තු 31** ට පිරිවැය 2013 | 2012 | **අප්‍රේල් 1** දිනට පිරිවැය 2011 |
|---|---|---|---|---|---|
| සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවට් ලිමිටඩ්) | 156,942 | 39% | 1,569,420 | 1,569,420 | 1,569,420 |
| සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් (සිංගප්පූරුව) | 24,500 | 49% | 143,622 | 143,622 | 143,622 |
| | | | 1,713,042 | 1,713,042 | 1,713,042 |

**15.1**ස්කන්ධ ක්‍රමය අනුව ආශ්‍රිත සමාගම්වල ආයෝජන සංචලනය

| | | | |
|---|---|---|---|
| ශුද්ධ වත්කම්වල ආයෝජකයාගේ කොටස අප්‍රේල් 01 දිනට ශේෂ | 196,912,331 | 178,287,651 | 1,713,042 |
| SLFRS ප්‍රමිතීන්ට මාරුවූ දිනට, රඳවාගත් ඉපැයීම්වල සීරුමාරු කිරීම් | - | - | 176,574,609 |
| ආශ්‍රිත සමාගම්හි ලාභයේ කොටස (බදුහැර) | 21,387,7 | 18,954,260 | - |
| ලාභාංශ ආදායම | (329,580) | (329,580) | - |
| මාර්තු 31 දිනට ශේෂය | 217,970,518 | 196,912,331 | 178,287,651 |

**15.2** ස්කන්ධ ක්‍රමය අනුව ආශ්‍රිත සමාගම් හි ආයෝජනවල ඉදිරියට ගෙනයන වටිනාකම

| | | | |
|---|---|---|---|
| සිලෝන් ෂිපිං ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 178,290,820 | 62,756,362 | 151,087,866 |
| සිලෝන් ෂිපිං ඒජන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් | 39,679,698 | 34,155,969 | 27,199,785 |
| | 217,970,518 | 196,912,331 | 178,287,651 |

**15.3** ආශ්‍රිත සමාගම් පිළිබඳ සාරාංශගත මූල්‍ය තොරතුරු

| | සිලෝන් ෂිපිං ඒජන්සි සිංගප්පූරුව | | සිලෝන් ෂිපිං ලයින්ස් | |
|---|---|---|---|---|
| | **2012** | **2011** | **2012** | **2011** |
| මුළු වත්කම් | 204,433,934 | 156,753,333 | 585,027,862 | 534,348,002 |
| මුළු වගකීම් | 101,309,507 | 79,587,755 | 75,166,902 | 64,345,369 |
| ශුද්ධ වත්කම් | 103,124,427 | 77,165,578 | 509,860,960 | 470,002,633 |
| ආදායම | 899,754,150 | 726,633,104 | 371,189,029 | 319,172,097 |
| මෙහෙයුම් වියදම් | 887,746,815 | 711,753,022 | 377,739,625 | 317,607,247 |
| වෙනත් ආදායම් | 70,295 | 500,483 | 29,941,039 | 19,784,015 |
| වසර සඳහා ලාභය | 11,272,918 | 14,196,294 | 40,678,398 | 30,765,339 |

**16.** මූල්‍ය සාධන පත්‍ර මූල්‍ය වත්කම් වර්ග හා මූල්‍ය බැඳියාවන්

මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශය තුල වාර්තා වූ මූල්‍ය වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම පහත දැක්වේ.

| **16.1 මූල්‍ය වත්කම්** | සටහන | **2013** | **2012** | **2011 අප්‍රේල් 01 දිනට** |
|---|---|---|---|---|
| විකිණීමට ඇති මූල්‍ය වත්කම් | | | | |
| ලැයිස්තුගත ආයෝජන | සටහන 17.1 | 35,450,738 | 41,818,848 | 46,350,462 |
| ලැයිස්තුගත නොවූ ආයෝජන | සටහන 17.2 | 2,377,070 | 2,377,070 | 2,377,070 |
| | | 37,827,808 | 44,195,918 | 48,727,532 |

ලැයිස්තුගත ආයෝජන ගණනය කරනු ලබන්නේ සක්‍රිය වෙළඳපොලේ ලැයිස්තුගත මිල පදනම් කරගත් සාධාරණ මිල අනුවය. ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ මිල ස්ථිරසාර අයුරින් පිරිවැය අනුව ගණනය කළ නොහැකි බැවින් අපවයවීම් සඳහා වූ ප්‍රතිපාදන අඩුකොට ආගණනය කෙරේ.

**කල්පිරීම් ආයෝජන**

| | | | | |
|---|---|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන | සටහන 21 | 131,700,530 | 93,430,380 | 154,204,954 |
| | | 131,700,530 | 93,430,380 | 154,204,954 |

කල්පිරීම් ආයෝජන ගණනය කරනු ලබන්නේ පොලී ලැබීම් නියමිත ඇතුළුවය.

ණය හා ලැබීම් නියමිත

| | | | | |
|---|---|---|---|---|
| වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | සටහන 19 | 1,301,671,157 | 866,860,709 | 464,011,076 |
| කෙටි කාලීන ආයෝජන | සටහන 22 | 205,054,559 | 179,708,322 | 397,197,981 |
| මුදල් හා මුදල් සමානයන් | සටහන 23 | 73,186,619 | 63,498,493 | 244,563,835 |
| | | 1,579,912,335 | 1,110,067,524 | 1,105,772,892 |

ණය සහ ලැබීම් නියමිතවල ඉදිරියට ගෙනයන වටිනාකම අනුව සඳහන් කර ඇත්තේ ඉදිරියට ගෙනයන වටිනාකම සාධාරණ මිලට ආසන්න වන හෙයිනි.

| | | | |
|---|---|---|---|
| මුළු මූල්‍ය වත්කම් | 1,749,440,673 | 1,247,693,822 | 1,308,705,378 |

**16.2 මූල්‍ය වගකීම්**

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් මූල්‍ය වගකීම් | | | | |
| වෙළඳ හා වෙනත් ගෙවීම් නියමිත | සටහන 30 | 874,692,411 | 642,776,449 | 841,894,736 |
| බැංකු අයිරා | සටහන 23 | - | 5,345,648 | 5,168,314 |
| | | 874,692,411 | 648,122,097 | 847,063,050 |

අනෙකුත් මූල්‍ය වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම, ඒවායේ සාධාරණ වටිනාකමට ආසන්න වන බැවින් ඒවායේ ඉදිරියට ගෙනයන වටිනාකම අනුව සඳහන් කරන ලදී.

| | | | |
|---|---|---|---|
| මුළු මූල්‍ය වගකීම් | 874.692,411 | 648,122,097 | 847,063,050 |

**17. විකිණීමට ඇති මූල්‍ය වත්කම්**

| | | 2013 | 2012 | 2011 අප්‍රේල් 01 දිනට |
|---|---|---|---|---|
| ලැයිස්තුගත ආයෝජන | සටහන 17.1 | 35,450,738 | 41,818,848 | 46,350,462 |
| ලැයිස්තුගත නොවන ආයෝජන | සටහන 17.2 | 2,377,070 | 2,377,070 | 2,377,070 |
| | | 37,827,808 | 44,195,918 | 48,727,532 |

**17.1 ලැයිස්තුගත ආයෝජන**

| | | | |
|---|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 41,818,848 | 46,350,462 | 3,103,122 |
| ලැබීම්/(පාඩු) (සාධාරණ මිල සීරුමාරු කිරීම් මත) | (6,368,110) | (4,531,614) | 43,247,340 |
| මාර්තු 31 දිනට ශේෂය | 35,450,738 | 41,818,848 | 46,350,462 |

| | | 2013 | | 2012 | | 2011 | |
|---|---|---|---|---|---|---|---|
| | **කොටස් සංඛ්‍යාව** | **පිරිවැය (රු.)** | **වෙළෙඳපොල වටිනාකම** | **පිරිවැය (රු.)** | **වෙළෙඳපොල වටිනාකම** | **පිරිවැය (රු.)** | **වෙළෙඳපොල වටිනාකම** |
| මර්කන්ටයිල් ෂිපිං කොම්පැනි පීඑල්සී | 238,506 | 2,068,800 | 34,416,416 | 2,068,800 | 40,784,526 | 2,068,800 | 45,316,140 |

**17.2 ලැයිස්තුගත නොවූ ආයෝජන**

ලැයිස්තුගත නොවූ ආයෝජනවල සාධාරණ මිල සහතික ලෙස ගණනය කළ නොහැකි බැවින් අපවයවීම් අඩුකොට පිරිවැය අනුව සඳහන් කොට තිබේ.

| කොටස් සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|
| ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් | | | | |
| ඔෆ් සිලෝන් ලිමිටඩ් | 31,206 | 312,060 | 312,060 | 312,060 |
| සිලෝන් පෝට් සර්විසස් ලිමිටඩ් | 5,000 | 50,000 | 50,000 | 50,000 |
| ශ්‍රී ලංකා පෝට් මැනේජ්මන්ට් | | | | |
| ඇන්ඩ් කන්සල්ටන්සි ලිමිටඩ් | 1,501 | 15,010 | 15,010 | 15,010 |
| ලංකා කෝල් කම්පනි | | | | |
| (ප්‍රයිවට් )ලිමිටඩ් | 200,000 | 2,000,000 | 2,000,000 | 2,000,000 |
| | | 2,377,070 | 2,377,070 | 2,377,070 |

**18.** විලම්බිත බදු වත්කම්

| | | | |
|---|---|---|---|
| අප්‍රේල් 01 දිනට ශේෂය | 17,875,603 | 19,490,383 | 4,863,024 |
| සවිස්තරාත්මක ආදායම තුල හඳුනාගත් | (14,695,235) | (1,614,780) | 20,161,094 |
| කොටස් ස්කන්ධ තුල හඳුනාගත් | - | - | (7,309,686) |
| SLFRS ප්‍රමිතීන්ට මාරුවූ දිනට රඳවාගත් | | | |
| ඉපැයීම් සඳහා සීරුමාරු කිරීම් | - | - | 1,775,951 |
| මාර්තු 31 දිනට ශේෂය | 3,180,367 | 17,875,603 | 19,490,383 |

වත්කම් හා වගකීම්වල ඉදිරියට ගෙනයන වටිනාකම හා වත්කම් වගකීම්වල බදු පදනමේ ඉදිරියට ගෙනයන වටිනාකම අතර වූ තාවකාලික වෙනස සඳහා බැදියා ක්‍රමය (Liability method) යොදාගෙන විලම්බිත බදු හඳුනා ගනු ලැබේ. විලම්බිත බද්ද 28% සඵල පොලී අනුපාතය යොදා ගනිමින් ගණනය කරනු ලැබ තිබේ.

**18.1** බදු වත්කම් හා වගකීම්වල විලම්බිත බදු විශ්ලේශණය

| | | | |
|---|---|---|---|
| විලම්බිත බදු බැදියාවන් | | | |
| ප්‍රත්‍යාගණන ලැබීම් | (7,309,686) | (7,309,686) | (7,309,686) |
| ත්වරිත ක්ෂයවීම් වලින් | (4,630,234) | (4,394,685) | (7,493,088) |
| | (11,939,920) | (11,704,371) | (14,802,774) |
| විලම්බිත බදු වත්කම් | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන්ගෙන් | 5,128,331 | 6,143,723 | 6,614,800 |
| ඉදිරියට ගෙනආ බදු අහිමිවීම් | - | 14,459,697 | 18,701,803 |
| ගිණුම් ප්‍රතිපාදන වලින් | 9,991,957 | 8,976,554 | 8,976,554 |
| | 15,120,288 | 29,579,974 | 34,293,157 |
| | 3,180,368 | 17,875,603 | 19,490,383 |

විලම්බිත බදු වත්කම් විශ්‍රාම ප්‍රතිලාභ බැදියාවන් උදෙසා ප්‍රතිපාදන වශයෙන් ද, සෙසු ලැබීම් නියමිත අපමය ප්‍රතිපාදන සඳහා ද හඳුනා ගැනෙන අතර, ඉදිරියට ගෙනයන බදු අහිමිවීම් අනාගත ලාභ (බද්දට යටත්) සම්භාවී වන තරමට උපලබ්ධි කෙරෙන අතර විලම්බිත බදු බැදියාවන් ක්ෂය කිරීම් හා ප්‍රත්‍යගණන අතිරික්ත ත්වරණය කිරීම් සඳහා හඳුනා ගැනේ. වත්කම් හා බැදියාවන් නැවත ගණනය කිරීම සම්බන්ධයෙන් ගත්කල SLFRS ප්‍රමිතීන්ට මාරු වූ දිනයේදී සිදුකරන ලද සීරුමාරු කිරීම් වලින් උද්ගත වන විලම්බිත බදු බැදියාවන් හා වත්කම් රඳවාගත් ඉපැයීම්වලට සීරුමාරු කරන ලදී.

| | | 2013 | 2012 | 2011 අප්‍රේල් 01 දිනට |
|---|---|---|---|---|
| **19.** වෙළඳ හා වෙනත් ලැබීම් නියමිත | | | | |
| වෙළඳ ලැබීම් නියමිත | සටහන 19.1 | 1,106,719,797 | 733,892,825 | 334,913,646 |
| තැන්පතු හා අත්තිකාරම් | සටහන 19.2 | 9,802,280 | 8,133,542 | 7,400,315 |
| කාර්ය මණ්ඩල ලැබීම් නියමිත | සටහන 19.3 | 31,922,673 | 26,482,148 | 24,141,923 |
| වෙනත් ලැබීම් නියමිත | සටහන 19.4 | 5,704,423 | 1,438,457 | 641,454 |
| වෙළඳ ලැබීම් නියමිත | | 1,154,149,173 | 769,946,972 | 367,097,338 |

| | 2013 | 2012 | 2011 අප්‍රේල් 01 දිනට |
|---|---|---|---|
| **19.1** වෙළඳ ලැබීම් නියමිත | 1,254,241,780 | 830,806,563 | 431,827,384 |
| අපවයවීම් සඳහා ප්‍රතිපාදන | (147,521,983) | (96,913,738) | (96,913,738) |
| | 1,106,719,797 | 733,892,825 | 334,913,646 |

සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබෙන පහත දැක්වෙන ලැබීම් නියමිත වලින් වෙළඳ ලැබීම් නියමිත සමන්විත වේ.

| සම්බන්ධිත පාර්ශවවලින් ලැබීම් නියමිත | | | |
|---|---|---|---|
| රජයේ ආයතන | 83,978,353 | 77,525,892 | 80,626,985 |
| | 83,978,353 | 77,525,892 | 80,626,985 |

වෙළඳ ලැබීම් නියමිත වෘද්‍යාභාවයට පත්වීම

| | | | |
|---|---|---|---|
| එක් වසරක් දක්වා | 945,431,108 | 586,941,112 | 174,878,841 |
| වර්ෂ 1-4 දක්වා | 94,285,924 | 44,605,596 | 66,818,894 |
| වර්ෂ 4 ට වැඩි | 214,524,748 | 199,259,855 | 190,129,649 |
| | 1,254,241,780 | 830,806,563 | 431,827,384 |

වෙළඳ ලැබීම් නියමිත අපවයවීම් සමාලෝචනය කරන ලදී. ඇතැම් වෙළඳ ලැබීම් නියමිත අපවය වී ඇතිබව පෙනී යන ලදී. එවැනි අපවයවීම් සඳහා සටහන 2.11 පරිදි ප්‍රතිපාදන සලසන ලදී.

වෙළඳ ලැබීම් නියමිත අපවයවීම් වෙනුවෙන්
සලසන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තර

| | | | |
|---|---|---|---|
| රජයේ ආයතන | 36,206,870 | 36,206,870 | 36,206,870 |
| විදේශීය නියෝජිතයන් | 35,123,350 | 4,072,991 | 4,072,991 |
| පෞද්ගලික ආයතන | 43,405,411 | 43,405,411 | 43,405,411 |
| වෙනත් | 29,453,384 | 9,895,498 | 9,895,498 |
| | 144,189,015 | 93,580,770 | 93,580,770 |

වෙළඳ ලැබීම් නියමිතවල ඉදිරියට
ගෙනයන වටිනාකම් (විදේශ ව්‍යාවහාර මුදල් අනුව)

| | | | |
|---|---|---|---|
| එ.ජ. ඩොලර් | 19,218,452 | 18,482,484 | 108,667,021 |
| ඉන්දියානු රුපියල් | 16,373,733 | 16,373,733 | 16,373,733 |
| යූරෝ | 1,388,821 | 1,388,821 | 1,388,821 |
| වෙනත් | 4,038,520 | 4,044,132 | 4,044,132 |
| | 41,019,526 | 40,289,170 | 130,473,707 |

**19.2 තැන්පතු හා අත්තිකාරම්**

| | | | |
|---|---|---|---|
| බහාළුම් සඳහා තැන්පතු | 4,311,796 | 4,279,316 | 4,279,166 |
| වෙනත් ආපසු ගෙවිය යුතු තැන්පතු | 7,914,465 | 7,914,465 | 7,914,465 |
| ගෙවූ අත්තිකාරම් | 5,904,929 | 4,268,671 | 3,535,594 |
| අපමය ප්‍රතිපාදන | (8,328,910) | (8,328,910) | (8,328,910) |
| | 9,802,280 | 8,133,542 | 7,400,315 |

**19.3 කාර්ය මණ්ඩල ලැබීම් නියමිත**

| | | | |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | 29,741,877 | 25,486,044 | 23,585,247 |
| අත්තිකාරම් හා වෙනත් | 2,180,796 | 636,104 | 556,676 |
| | 31,922,673 | 26,482,148 | 24,141,923 |

**19.4 වෙනත් ලැබීම් නියමිත**

| | | | |
|---|---|---|---|
| සහතික කල අළුත්වැඩියා | | | |
| ලැබීම් නියමිත | 19,839,635 | 19,839,635 | 19,839,635 |
| වෙනත් | 9,595,000 | 5,329,034 | 4,532,031 |
| අපමය ප්‍රතිපාදන | (23,730,212) | (23,730,212) | (23,730,212) |
| | 5,704,423 | 1,438,457 | 641,454 |

**20. ව්‍යවස්ථාපිත ලැබීම් නියමිත**

| | | | |
|---|---|---|---|
| ආර්ථික සේවා ගාස්තු (ESC) | 1,915,323 | 1,915,323 | 8,309,175 |
| රඳවා ගැනීම් බද්ද | 14,675,878 | 11,196,516 | 10,009,328 |
| භාණ්ඩ හා සේවා බද්ද | 18,936,777 | 18,936,777 | 18,936,777 |
| ජාතික ආරක්ෂක බද්ද | 2,612,349 | 2,612,349 | 2,612,349 |
| එකතු කල අගය මත බද්ද | - | - | 8,519,638 |
